


විදුදය
භාෂා, සාහිත්‍ය, සංස්කෘතික හා මාධ්‍ය අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

VIDUDAYA
Journal of Language, Literary, Cultural and Media Studies
Department of Sinhala and Mass Communication, University of Sri Jayewardenepura

**2026, 05 (01):** 52-80

**ISSN: 3051-5424**

**Journal homepage:** https://journals.sjp.ac.lk/index.php/vidudaya

# කාලිදාස මහකවියාගේ ජීවන සමය පිළිබඳ විද්වත් මත සමාලෝචනයක්

පූජ්‍ය ශ්‍රාවස්තිපුර ශාන්තසිරි හිමි

භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
sravasthipura@sjp.ac.lk

## Abstract

This study examines the chronology of the great Sanskrit poet Kālidāsa. As the author of distinguished literary works such as *Kumārasambhava*, *Raghuvaṃśa*, *Mālavikāgnimitra*, *Vikramorvaśīya*, *Abhijñānaśākuntala*, and *Meghadūta*, Kālidāsa represents the highest expression of creative genius in classical Indian literature. However, the absence of autobiographical details in his writings, together with the admiration and reverence accorded to him by later poets, has led to enduring uncertainty regarding the period in which he lived. Consequently, the chronology of Kālidāsa has remained a long-standing problem in the history of Sanskrit literature. This study seeks to identify his historical period through an examination of legends, dramatic and epic literature, inscriptions, astronomical references, and both traditional and modern critical studies.Scholars have proposed a wide range of views concerning Kālidāsa's chronology, placing him within a period extending from the eighth century BCE to the eleventh century CE. The principal problem addressed in this research is the determination of the most historically plausible period among these competing theories. Establishing Kālidāsa's chronology is essential for achieving a deeper understanding of the development of Sanskrit literary history and for interpreting the historical and cultural context of his works with greater accuracy. Accordingly, the objective of this study is to determine Kālidāsa's probable historical period on the basis of internal evidence found in his works together with literary, historical, philological, and scholarly sources. The study is primarily qualitative in nature. Methodologies employed include textual and documentary analysis, philological-historical criticism, comparative literary analysis, and astronomical dating. Primary sources for the study include the works of Kālidāsa and those of Aśvaghoṣa, Bhāsa, Vātsyāyana, Bāṇa, and Kalhaṇa, together with inscriptional evidence such as the Mandsaur and Aihole inscriptions. Modern scholarly studies and critical writings were also consulted. Textual references, linguistic and philological evidence, astronomical calculations, historical records, and other primary and secondary materials were comparatively and analytically examined. The evidence, arguments, and counterarguments associated with the major chronological theories were then synthesized and critically evaluated. The study identified approximately ten major theories concerning Kālidāsa's chronology, ranging from the eighth century BCE to the eleventh century CE. Critical analysis demonstrated that attempts to place Kālidāsa in a pre-Christian period are not supported by sufficient historical evidence. Similarly, the association between Kālidāsa and Vikramāditya appears to remain largely within the domain of legend. Comparative examination of similarities with Aśvaghoṣa indicates that Kālidāsa belongs to a later period. Astronomical evidence, although noteworthy, proved insufficient to establish a definitive conclusion independently.The analysis suggests that the period between 350 and 425 CE, corresponding to the reign of Candragupta II of the Gupta dynasty, constitutes the most plausible historical context for Kālidāsa. This conclusion is supported by the linguistic and stylistic characteristics of his works, their historical setting, and corroborative later evidence. References associated with earlier figures such as Bhāsa and Vātsyāyana, as well as later writers including Vatsabhaṭṭi, Bāṇa, and Ravikīrti, further strengthen this conclusion. In addition, historical traditions connected with works such as *Kuntaleśvaradautya* and *Setubandha* provide supporting

evidence for Kālidāsa's association with the Gupta imperial milieu. The findings of this study contribute to a more precise understanding of the chronology of Kālidāsa and thereby assist in refining the chronological framework of Sanskrit literary history. Establishing Kālidāsa within the Gupta period enables a clearer understanding of the historical, cultural, and socio-political background reflected in his works. Furthermore, the study provides a foundation for future research concerning the historical development of classical Sanskrit literature and its intellectual milieu.

**Keywords:** Chronology of Kālidāsa, Gupta Age, Sanskrit literature, Sanskrit drama, Indian history.

## 01. හැඳින්වීම

මෙම පර්යේෂණයේ දී කාලිදාස මහාකවියාගේ ජීවන කාලය (Chronology) පිළිබඳ විමසීමක් සිදු කෙරෙයි. කුමාරසම්භව, රඝුවංශ, මාලවිකාග්නිමිත්‍ර, වික්‍රමෝර්වශීය, අභිඥානශාකුන්තල සහ මේඝදූත වැනි සංස්කෘත සාහිත්‍යයේ විශිෂ්ට කාව්‍ය නිර්මාණවල කර්තෘ වන ඔහු භාරතීය කවීන්ගේ නිර්මාණාත්මක ප්‍රතිභාවෙහි උපරිමය සලකුණු කොට ඇත. තම නිර්මාණවල පෞද්ගලික තොරතුරු ඇතුළත් නොකිරීමත්, පසුකාලීන කවීන්ගේ ආදරය හා ගෞරවයත් නිසා කාලිදාසගේ ජීවන සමය පිළිබඳ අවිනිශ්චිතතාවක් පවතින අතර එය සාහිත්‍ය ඉතිහාසයේ දිගුකාලීන ගැටලුවකි. ජනප්‍රවාද, නාට්‍ය, මහාකාව්‍ය, ශිලාලේඛන, ජ්‍යෝතිශ්ශාස්ත්‍රීය කරුණු, පසුකාලීන හා නූතන විචාර ග්‍රන්ථ ඇසුරින් එම කාලය හඳුනාගැනීමට මෙහි දී උත්සාහ දැරෙයි. විවිධ විද්වතුන් විසින් ක්‍රි.පූ. **8** වැනි සියවස සිට ක්‍රි.ව. **11** වැනි සියවස දක්වා විහිදෙන ශතවර්ෂ දහනවයකට ආසන්න කාල පරාසයක කාලිදාස ස්ථානගත කර අදහස් හා මතවාද ඉදිරිපත් කොට ඇත. එම විවිධ මත අතුරින් වඩාත් නිවැරදි ඓතිහාසික සමය නිශ්චය කිරීමට කාලිදාසගේ නිර්මාණවල අන්තර්ගත ඉඟි සහ වෙනත් සාහිත්‍යමය, ශාස්ත්‍රීය සහ ඓතිහාසික මූලාශ්‍රය පදනම් කර ගනිමින් කාලසීමාව නිර්ණය කිරීමට මෙම පර්යේෂණයේ දී තැත් කෙරෙයි. කාලිදාසගේ නිශ්චිත ඓතිහාසික සමය ස්ථාපිත කිරීමෙන් සාහිත්‍ය ඉතිහාසයේ කාලානුක්‍රමය වඩාත් නිවැරදි වන අතර එයින් ඔහුගේ කෘතිවල ඓතිහාසික-සමාජීය සන්දර්භය තේරුම් ගැනීමට සහ නිර්මාණවලට බලපෑ සමාජ-දේශපාලනික සාධක හඳුනාගැනීමට හැකි වන අතර ම ඉදිරි පර්යේෂණ සඳහා ශක්තිමත් පදනමක් ද සැපයෙයි. සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබාගැනීමට සිසුන්ට, පර්යේෂකයන්ට සහ රසිකයන්ට මෙය ප්‍රයෝජනවත් වනු ඇත.

## 02. ක්‍රමවේදය

කාලිදාසගේ ජීවන සමය කුමක් දැයි ප්‍රධාන ගැටලුව ලෙස ගනිමින් සිදුවන මෙම අධ්‍යයනය ගුණාත්මක (**Qualitative**) පර්යේෂණයක් ලෙසින් මූලික ව හැඳින්විය හැකි ය. මෙහි සන්ධාර විශ්ලේෂණ ක්‍රමය, (Textual/ documentary analysis) ඓතිහාසික-වාග්විද්‍යාත්මක විචාරය (Philological-historical criticism), තුලනාත්මක අධ්‍යයනය **(Comparative study)** හා තාරකා විද්‍යාත්මක සංසිද්ධි ගැලපීම (Astronomical dating) වැනි විධික්‍රම භාවිත කෙරිණි. කාලිදාසගේ නිර්මාණ, අශ්වඝෝෂ, භාස, වාත්ස්‍යායන, බාණ, කල්හණ ආදීන්ගේ කෘති, මන්දසෝර්, ඓහෝල් ශිලා ලේඛන වැනි මූලාශ්‍රය සහ නවීන විචාරකයන්ගේ කෘති මූලික දත්ත ප්‍රභවයන් ලෙස භාවිත කෙරිණි. ග්‍රන්ථාශ්‍රිත තොරතුරු, ජ්‍යොතිශ්ශාස්ත්‍රීය ගණනය කිරීම්, භාෂා විද්‍යාත්මක සාධක, ඓතිහාසික වාර්තා සහ අනෙකුත් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය සංසන්දනාත්මක ව හා විශ්ලේෂණාත්මක ව අධ්‍යයනය කොට විවිධ මතයන්ගේ සාධක සහ ප්‍රතිතර්ක සම්පිණ්ඩනය කර තාර්කික විග්‍රහයකට ලක් කොට ඇත.

## 03. සාකච්ඡාව

පදයක්, පදිමයක් වැනි වදන් දිය පොදකින් අරුත් සයුරක් මවා එහි ශෘංගාර, වීර, හාස්‍යාදි රස රැළි මාලා මතු කරන කාලිදාස මහකවියා සංස්කෘත සාහිත්‍යාම්බරයේ සිකුරු තරුව ලෙස හඳුන්වාදිය හැකි ය. සම්භාව්‍ය සංස්කෘත සාහිත්‍යයේ උදාව පිළිබඳ ඇතැම් කියවීම් අනුව ආරම්භක ස්ථානයේ පහන් තරුව ලෙස වැජඹුණු කාලිදාසයෝ එහි අස්තයේ ඉරබටු තරුව ලෙස විරාජමාන වෙති. සියවස් ගණනක් පුරා ගොඩනැගුණු සම්ප්‍රදාය තුළ ඔහුගේ නියෝජනය දක්නට ලැබෙන්නේ ජරා මරණයෙන් මිදුණු අමරණීය කාව්‍ය චක්‍රවර්තියකු ලෙස ය. ක්‍රිස්තු පූර්ව අටවැනි සියවසේ පමණ සිට ක්‍රිස්තු වර්ෂ එකොළොස්වැනි සියවස පමණ දක්වා සහස්‍ර දෙකකට ආසන්න කාල පරාසයක කාලිදාස සිය කවි නිමැවුම් සහ දිවි සැරිය කළ බවක් භාරතීය සම්ප්‍රදායානුගත ප්‍රවාද විමසන විට ප්‍රකට වෙයි. සිය නිමැවුම්වල පෞද්ගලික තොරතුරු කිසිවක් ම ඇතුළත් නොකිරීම සහ කවිකුලගුරු මහ කවියාගේ නමට ලැබුණු බුහුමන සිය කෘතීනට හෝ ලබාදීමට පසුකාලීන කවීන් ගත් උත්සාහය මෙම තත්ත්වයට මූලික හේතු වී ඇත. දහ අටවැනි සියවසේ දී සර් විලියම් ජෝන්ස් (**1746 -1794**) කාලිදාස නූතන බටහිර ලෝකයට හඳුන්වාදුන් අවස්ථාවේ පටන් ශාස්ත්‍රීය ලේඛන දහස් ගණනක් සම්පාදනය වුවත් ඔහුගේ කාල නිර්ණය අද වන විටත් ගැටලුවක් ව පවතී. කාලිදාසගේ නිර්මාණවල යටි පෙළ අරුත්, පසුකාලීන කවි, විචාරක සහ ඓතිහාසික මූලාශ්‍රය ඇසුරෙන් ඔහුගේ ජීවන සමය පිළිබඳ විමසීමක් කිරීම මෙම ලේඛනයේ අරමුණ වෙයි.

නාට්‍ය ප්‍රස්තාවනාවන්හි කර්තෘ නාමය දක්වන කාලිදාස කාව්‍ය ග්‍රන්ථයන්හි නම වත් සඳහන් කොට නැත. ඔහුගේ අනුග්‍රාහකයා පිළිබඳ කිසි දු නිසැක තොරතුරක් සඳහන් නොවන අතර ඇත්තේ අවිනිශ්චිත අනුමාන පමණකි. අඳුරු ඉතිහාසයක කාලිදාසගේ තොරතුරු සෙවීමට මන්දාලෝකයක් සපයන ඔහුගේ නිර්මාණ අතුරින් මාලවිකාග්නිමිත්‍රය, වික්‍රමෝර්වශීය, අභිඥානශාකුන්තලය, මේඝදූතය, රඝුවංශය සහ කුමාරසම්භවය විශේෂයෙන් සඳහන් කළ යුතු ය. එ ද එහි අරුත්වලින් හැඟවෙන සියුම් ඉඟි ඔස්සේ ය. කාලිදාස නමට පැවරී ඇති සේතුබන්ධ නම් ප්‍රාකෘත මහාකාව්‍යය සහ කුන්තලේශ්වරදෞත්‍ය නම් කාව්‍යය ද මෙහි ලා යම් දායකත්වයක් සපයයි. ඔහු පිළිබඳ සාකච්ඡා කළ කවි විචාරක ලේඛන අතුරින් ජීවන සමය පිළිබඳ මෑත සීමාව නිසැක ව පැවසිය හැකි විශේෂ ප්‍රකාශයක් ලෙස බාණයන්ගේ හර්ෂචරිතය නම් කළ හැකි ය. දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශය, ආනන්දවර්ධනගේ ධ්වන්‍යාලෝකය, භවභූතිගේ නාට්‍ය නිර්මාණ, වාමනගේ කාව්‍යාලඞ්කාරසූත්‍රවෘත්ති, රාජශේඛරගේ කාව්‍යමීමංසා, භෝජරාජගේ ශෘඞ්ගාරප්‍රකාශය, ජල්හණගේ සූක්තිමුක්තාවලී, ක්ෂේමේන්ද්‍රගේ ඖචිත්‍යවිචාරචර්චා සහ කල්හණගේ රාජතරඞ්ගිණී වැනි කෘතිවල කාලිදාස පිළිබඳ තරමක විශ්වාසදායී තොරතුරු සැඟවී පවතියි. බුද්ධපුත්‍ර හිමිගේ පූජාවලිය සහ පැරකුම්බා සිරිත වැනි ලාංකේය කෘතිවල ද ජනප්‍රවාදාගත පුවත් ඇතුළත් ය. එම ග්‍රන්ථයන්හි අන්තර්ගත තොරතුරු විමසන නවීන විචාරකයන් සහස්‍ර දෙකකට ආසන්න කාලපරාසයක විවිධ තැන්වල භාරතීය මහාකවියා ස්ථානගත කොට ඇත. එම කාලරේඛාවේ පිහිටුවීම් පිළිබඳ මත මෙලෙස සම්පිණ්ඩනය කළ හැකි ය.

3.1. ක්‍රි.පූ. අටවැනි සියවස - රඝුවංශයේ නිමාව සලකුණු කෙරෙන XIX වැනි සර්ගයේ වර්ණනයට ලක් වන අග්නිවර්ණ රජුගේ සමකාලීනයකු වන බව උපකල්පනය කොට.

3.2. ක්‍රි.පූ. දෙවැනි සියවස - මාලවිකාග්නිමිත්‍රයේ නායක අග්නිමිත්‍ර රජු කාලිදාසගේ අනුග්‍රාහකයා වූයේ යැයි සලකා.

3.3. ක්‍රි.පූ. පළමුවැනි සියවස - වික්‍රම සංවත්සර ක්‍රමය ඇරඹූ වික්‍රමාදිත්‍ය රජු මෙම අවධියේ විසූ බවත් ඔහු කාලිදාසගේ අනුග්‍රාහකයා වූ බවත් කල්පනය කොට.

3.4. ක්‍රි.ව. පළමුවැනි සියවසට පෙර - අශ්වඝෝෂ කාලිදාසගේ ආභාසය ලබන්නට ඇතැයි සලකා.

3.5. ක්‍රි.ව. තෙවැනි සියවස - ජ්‍යොතිර්විද්‍යාත්මක සංසිද්ධියක් සමග රඝුවංශයේ ප්‍රකාශයක් ගළපමින්.

3.6. ක්‍රි.ව. පස්වැනි සියවස - රඝුවංශාගත පුවතක් ස්කන්ධගුප්තගේ ගිර්නාර් පර්වත ලිපියෙහි පැවසෙන හූණයන්ගේ පරාජය සමග ගළපමින්.

3.7. ක්‍රි.ව. සවැනි සියවස

   i. ඓතිහාසික මූලාශ්‍රයන්හි තොරතුරුවල ව්‍යාකූලතා හේතු කොටගෙන ක්‍රි.ව. **544** දී මාලව දේශය පාලනය කළ යශෝධර්මන් රජු වික්‍රමාදිත්‍ය රජු ලෙස හඳුනාගෙන.

   ii. දක්ෂිණාවර්තනාථ සහ මල්ලිනාථ වැනි ටීකාකරුවන් මේඝදූතයේ පාඨයකට විස්තර සපයමින් දිඞ්නාග පිළිබඳ කරන සඳහන පදනම් කොට.

   iii. කාලිදාසගේ කෘතිවලින් හමුවන කාල සංකේත ඇසුරින් තාරකා විද්‍යාත්මක **(**Astronomical**)** කරුණු මත.

   iv. වරාහමිහිරයන්ගේ ජීවන සමය පිළිබඳ ග්‍රන්ථාගත පුවත් පදනම් කොට.

3.8. ක්‍රි.ව. සත්වැනි සියවස - ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදී සිටිය දී ගණිකාවක අතින් කාලිදාසගේ මරණය සිදු වීම පිළිබඳ ප්‍රවාදාගත කරුණු සලකමින්.

3.9. ක්‍රි.ව. එකොළොස්වැනි සියවස - ධාරාහි භෝජ රාජ සභාවෙහි කාලිදාස කටයුතු කළ බව කියැවෙන භෝජප්‍රබන්ධාගත තොරතුරු මත.

3.10. ගුප්ත යුගය (**320** සිට **455**) පිළිබඳ කල්පිතය - ගුප්ත පරපුරේ වික්‍රමාදිත්‍යගේ සම්බන්ධය හේතු කොටගෙන.

මෙම විවිධ අදහස් සහ මත, ඒවාට පදනම් වූ සාක්ෂි සාධක අනුව විමසීමට ලක් කරමු.

### 3.1. ක්‍රි.පූ. අටවැනි සියවස

කාලිදාසගේ ජීවන සමය පිළිබඳ අදහස් දැක්වූ විචාරකයන් අතුරින් ඉපැරණි ම අවස්ථාවක් යෝජනා කරන්නේ ප්‍රංශ ජාතික භාරතීයවේදියකු **(**Indologist**)** වන හිපොලිට් ෆොච් **(**Hippolyte Fauche **1797 - 1869)** ය. රඝුවංශය අවසන් වන XIX වැනි සර්ගය ආරම්භ වන්නේ සුදර්ශන රජු සිය පුතු අග්නිවර්ණ අභිෂේක කොට වනගත වන පුවතිනි. අග්නිවර්ණශෘඞ්ගාර නම් එම පරිච්ඡේදයේ අග්නිවර්ණගේ රාජ්‍ය පාලනයත් හදිසියේ සිදු වන ඔහුගේ මරණයත් ඉන් පසු ගර්භණී අගබිසවගේ ගර්භය අභිෂේක කිරීමත් ඇය අනාගත රජ කුමරු වෙනුවෙන් රාජ්‍ය පාලනය කිරීමත් කියැවෙයි. මෙම සිදු වීම් ක්‍රි.පූ. අටවැනි සියවසේ පමණ සිදු වන්නට ඇතැයි සැලකෙයි. ෆොච් පවසන්නේ අග්නිවර්ණගේ මරණයෙන් පසු ඔහුගේ අනුප්‍රාප්තිකයාගේ පාලන කාලයේ කාලිදාස රඝුවංශය රචනා කරන්නට ඇති බව යි. සජීවී ආකාරයෙන් වර්තමාන සහ සමීප අතීත කාල ආඛ්‍යාත භාවිත කරමින් කාලිදාස කරන එම විස්තරය සහ එයින් රඝුවංශය නිමා වීම යන කරුණු සාධක කොට ෆොච් සිය මතය ඉදිරිපත් කරයි **(**Fauche H. 2001**.)**

"तं भावार्थं प्रसवसमयाकाङ्क्षिणीनां प्रजाना -

मन्तर्गूढं क्षितिरिव नभोबीजमुष्टिं दधाना ।

मौलैः सार्धं स्थविरसचिवैर्हैमसिंहासनस्था

राज्ञी राज्यं विधिवदशिषद्भर्तुरव्याहताज्ञा ॥" (කාලිදාස,1936. රඝුවංශය, श्रीरघुवंशमहाकाव्ये ।१९ -५७॥)

වඩාත් විශ්වාසදායී ඓතිහාසික සාක්ෂ්‍ය නොමැති වීම, සාහිත්‍ය ඉතිහාසය සහ වාග්විද්‍යාත්මක කරුණු හේතු කොටගෙන මෙය ෆොච්ගේ හුදු කල්පනයක් පමණකැයි සැලකුණු නිසා මෙම මතයට විද්වතුන්ගේ සහාය නොලැබී යටපත් විය.

### 3.2. ක්‍රි.පූ. දෙවැනි සියවස

මෙම දෙවැනි මතවාදයෙන් පැවසෙන්නේ කාලිදාසගේ අනුග්‍රාහකයා අග්නිමිත්‍ර බවත් එනිසා කාලිදාසගේ ජීවන සමය ක්‍රි.පූ. දෙවැනි සියවසට අයත් බවත් ය. ඒ පිළිබඳ වැදගත් ම සාධකය ලෙස ඉදිරිපත් වන්නේ මාලවිකාග්නිමිත්‍රයේ භරත වාක්‍යයේ දෙවැනි අර්ධය යි. නාට්‍යයක් අවසානයේ ලබාදෙන සුබ පැතුම හෙවත් ආශීර්වාදාත්මක ප්‍රකාශය "භරතවාක්‍යය" ලෙස හැඳින්වේ. සාමාන්‍යයෙන් සංස්කෘත නාට්‍යකරුවෝ පොදුවේ රටට, රජුට, ප්‍රජාවට සහ සැමට සෙත් පතන ප්‍රකාශයක් නාට්‍යයේ විශේෂ චරිතයක් ලවා සිදු කරවති. එහි දී පොදුවේ සූර්යවංශික රජුනට හෝ සමකාලීන රාජ්‍ය නායකයා වන කවියාගේ අනුග්‍රාහක රජුට සෙත් පැතීම යන කරුණු දෙකෙන් එකක් සිදු වෙයි. මාලවිකාග්නිමිත්‍රයෙහි භරතවාක්‍යය එහි නායකයා වන විදිශාධිපති අග්නිමිත්‍ර රජුගේ ප්‍රකාශයක් ලෙස ඉදිරිපත් කැරෙයි.

"आशास्यमीतिविगमप्रभृति प्रजानां

संपद्यते न खलु गोप्तरि नाग्निमित्रे ॥ v.२०॥" (Sane, 1950. *Mālavikāgnimitra of Kalidasa*)

''අග්නිමිත්‍ර රාජ්‍යයේ ආරක්ෂකයා වන කල්හි රටවැසියන්ගේ අභිමතාර්ථ සම්බන්ධයෙන් කාලගුණික, රෝග, වසංගත උවදුරු සහ අසල්වාසී රාජ්‍යවලින් එල්ල වන යුද්ධ තර්ජන ආදියේ දුරු වීම නිසා සාධනය කළ නොහැකි යැයි දෙයක් නොමැත." මෙහි දී දෙවැනි වර්ගයේ එනම් සමකාලීන නායකයා නමින් ම සඳහන් කරමින් භරතවාක්‍යයක් සම්පාදනය කරන ලද්දේ අග්නිමිත්‍ර රජු කාලිදාසගේ අනුග්‍රාහකයා වූ නිසා යැයි ආචාර්ය කුන්හන් රාජා පවසයි. (Jain, 2024. xiii.) මෙම ශුභාශංසනාත්මක ප්‍රකාශයේ අග්නිමිත්‍රගේ පාලනය පිළිබඳ පැවසීමට කාලිදාස භාවිත කොට ඇත්තේ 'සංපද්‍යතේ' යන දිවාදි ගණික ආත්මනේ පදී √පද් ධාතු සිද්ධ (पद् पदँ गतौ दिवादिः आत्मनेपदी सकर्मकः अनिट्) වර්තමාන කාල, ප්‍රථම පුරුෂ ඒකවචන ආඛ්‍යාතය යි. වික්‍රමෝර්වශීය සහ අභිඥානශාකුන්තල යන නාටක දෙකෙහි ම භරතවාක්‍යයන්හි භාවිත කරන්නේ ආශීර්වාදාර්ථක ලෝට් ලකාර ආඛ්‍යාත යි. මෙලෙස වර්තමාන ආඛ්‍යාතයක් යෙදීම ද කාලිදාස අග්නිමිත්‍ර දෙදෙනාගේ සමකාලීන බව තහවුරු කරන්නක් ලෙස ඉදිරිපත් කෙරෙයි. දෙවැනි ව මෙම පාඨයේ ම සඳහන් ෂඩ්විධ උවදුරු දුරු කිරීම පිළිබඳ අදහස සලකා බලමින් එහි අවසන් කරුණ වන අසල්වැසි රජවරුන්ගෙන් සිදු වන කරදර දුරු කිරීම "प्रत्यासन्नाश्च राजानः" යන්නෙන් අග්නිමිත්‍ර ශක රාජ වංශිකයන් පැරදවීම පිළිබඳ පැවසෙන බව දැක්වෙයි. තෙවැනි ව මේඝදූතයේ දී කාලිදාස විදිශා නුවර වර්ණනා කරනුයේ (तेषं दिक्षु प्रथितविदिशालक्षणां राजधानीं । गत्वा सद्यः फलमविकलं कामुकत्वस्य लब्धा ॥ तीरोपान्तस्तनितसुभगं पास्यसि स्वादु । यस्मात् सभ्रूभङ्गं मुखमिव पयो वेत्रवत्याश्चलोर्मि ॥ २४॥ මේඝදූත, පූර්වමේඝය, 24 පද්‍යය.) සිය අනුග්‍රාහකයා වූ අග්නිමිත්‍රගේ අගනගරය වූ

නිසා යැ යි පැවසෙයි. මෙම තර්ක තුන පිළිබඳ විමසන වාසුදේව විෂ්ණු මිරාශි පවසන්නේ කාලිදාසගේ කාලය වන විට විශේෂයෙන් ඔහුගේ ප්‍රථම නිර්මාණයේ දී භරතවාක්‍යය පිළිබඳ පිළිගත් ආකෘතියක් හෝ නිශ්චිත අදහසක් නොමැති වීම සිය නියම අනුග්‍රාහකයාට හෝ පොදුවේ රාජකීයයනට සෙත් පැතීම යන කරුණ කාලිදාසට මඟ හැරෙන්නට හේතු වූ බව යි. මාලවිකාග්නිමිත්‍රයට අනුව පුෂ්‍යමිත්‍ර යුද වදින්නේ යවනයන් සමග ය. **"स सिन्धोर्दक्षिणरोधसि चरन्नश्वानीकेन यवनानां प्रार्थितः । तत उभयोः सेनयोर्महानासीत्संमर्दः।"** (මාලවිකාග්නිමිත්‍ර v. අඞ්කය) එයින් දෙවැනි තර්කය බිඳවැටෙයි. "විදිශාව පිළිබඳ සලකා බලන හොත් එහි සමෘද්ධිය ගුප්ත යුගය දක්වා පැවතිණි." (මිරාශි, **1956**. **04**). ගුප්ත යුගයේ සිටි කාලිදාස කෙනකුට ද විදිශාව උත්කර්ෂයෙන් වැනීමේ අවස්ථාව අවශේෂ ව පැවතිණි. එසේ නම් එය ද අග්නිමිත්‍ර - කාලිදාස දෙදෙනා සම්මුඛ කෙරෙන ප්‍රබල සාධකයක් නො වෙයි. එනයින් කාලිදාසගේ කාලය ක්‍රි.පූ. තුන්වැනි සියවස වූ බවට ඇති මතය බිඳවැටෙයි.

කාලිදාසගේ කාලය පිළිබඳ සාකච්ඡාවක දී ශුඞ්ග රාජ වංශය අමතක කළ නොහැකි වෙයි. හේතුව නම් එහි ලා නිසැක පූර්ව කාල සීමාව ශුඞ්ග රාජවංශයේ ආරම්භකයා වූ පුෂ්‍යමිත්‍ර ශුඞ්ගට සම්බන්ධ වීම යි. මාලවිකාග්නිමිත්‍රයේ නායකයා පුෂ්‍යමිත්‍රගේ පුත්‍රයා වූ අග්නිමිත්‍ර යි. නාට්‍යයේ පස්වැනි අංකයෙහි පුෂ්පමිත්‍ර සහ වසුමිත්‍ර යන නාම ද හමු වෙයි. **"राजा - ( उपविश्य लेखनं सोपचारं गृहीत्वा वाचयति ) स्वस्ति यज्ञशरणात् सेनापतिः पुष्पमित्रो वैदिशस्थं पुत्रमायुष्मन्तमग्निमित्रं स्नेहात्परिष्वज्येदमनुदर्शयति। विदितमस्तु - योऽसौ राजयज्ञदीक्षितेन मया राजपुत्रशतपरिवृत्तं वसुमित्रं गोप्तारमादिश्य संवत्सरोपावर्तनीयो निरगंलस्तुरंगो विसृष्टः।"** (The Malavikagnimitra, 151.) මෙම නාම ශුංග රාජ පරම්පරාවට අයත් ය. මාලවිකාහි පුෂ්පමිත්‍ර ලෙස දැක්වෙන පුෂ්‍යමිත්‍ර වාච්‍ය කිරීමට අන්වර්ථ විශේෂණයක් යොදා ඇත. ඒ "සේනාපති" යන්න යි. උක්ත පාඨයේ සේනාපති යනු අග්නිමිත්‍රගේ සෙන්පති නොව පියා වූ පුෂ්පමිත්‍ර මහරජ වෙයි. ඔහු අවසන් මෞර්ය රජු වූ බෘහද්රථගේ සෙන්පති වීම මෙම අන්වර්ථ සංඥා නාමයට නිමිත්ත වී ඇත. ක්‍රි.පූ. **185** දී බෘහද්රථ ඝාතනය කොට මගධ රාජ්‍යයේ බලය මෞර්යයන්ගෙන් පැහැරගත් මොහු විසින් භාරතයෙහි නැවත බ්‍රාහ්මණ බලය නඟා සිටුවමින් අධිරාජ්‍යයක් පිහිටුවන ලදි. ඉන් පසු රාජසූය අශ්වමේධාදි යාග සිදු කළ බවට කියැවෙන ඓතිහාසික වාර්තා තහවුරු කිරීමක් මාලවිකාග්නිමිත්‍රයෙන් සිදු වෙයි. එම කරුණ දිව්‍යාවදානයේ අශෝකාවදානයෙහි ද සඳහන් ය. **"संपदिनो बृहस्पतिः पुत्रो बृहस्पतेर्वृषसेनो वृषसेनस्य पुष्यधर्मा पुष्यधर्मणः पुष्यमित्रः।"** (Mukhopadhyaya, S. 1960. **133.**) අග්නිමිත්‍ර ඔහුගේ පුත්‍රයා වන අතර වසුමිත්‍ර මෙම දෘශ්‍යකාව්‍යයේ සඳහන් වන ආකාරයට ම අග්නිමිත්‍රගේ පුත්‍රයා ය. පුෂ්‍යමිත්‍ර විසින් අශ්වමේධ යාගයක් ද සිදු කොට ඇත. (රණවීර, **1963**. **70.**) නූතන භාරතීය ඉතිහාසඥයෝ ද මෙම කරුණු සහතික කරති. "පුෂ්‍යමිත්‍ර ශුංග යනු ක්‍රි.පූ. **180** දී මෞර්ය අධිරාජ්‍යයේ අවසන් රජු වූ බෘහද්රථ ඝාතනය කොට බලය සියතට ගත් බ්‍රාහ්මණ වංශික වූ ශුංග පරපුරේ ආදිකර්තෘ ය" (තාපර්, **1994**. **84.**). ආර්. සී. මජුම්දාර්ට සහ ඒ. ඩී. පුසාල්කර්ට අනුව පුෂ්‍යමිත්‍රගේ කාලය ක්‍රි.පූ. **187-151** ය. පුෂ්‍යමිත්‍ර යනු ශුංග වංශයේ ස්ථාපකයා වේ. හෙතෙම මෞර්ය අධිරාජ්‍යයේ අවසාන රජු වූ බෘහද්රථ මෞර්යයා වංශගත කරමින් ක්‍රි.පූ. **187** දී අධිරාජ්‍යයේ බලය අල්ලාගත්තේ ය (Majumdar, 1951. 109.).

මෙලෙස කාලිදාස අග්නිමිත්‍ර පිළිබඳ දැනසිටීම ඔහුගේ කාලනිර්ණයේ පූර්ව සීමාව ක්‍රි.පූ. **180** හෝ **187** ලෙස සලකුණු කිරීමේ ලා වැදගත් වුවත් ඉන් ඔවුන්ගේ සමකාලීන බවක් කිසි සේත් නො පැවසේ.

### 3.3. ක්‍රි.පූ. පළමුවැනි සියවස

චින්තාමණී වාමන් වෛද්‍ය පවසන්නේ වික්‍රමාදිත්‍ය නම් නරේශ්වරයා ශකවරුන් පරාජය කිරීමෙන් අනතුරු ව සිදු කළ ස්වකීය අභිෂේකය අනුස්මරණය කරමින් වික්‍රම සංවත්සර ක්‍රමය ඇරඹූ බව යි **(**Vaidya**,** 1921.**).** ඒ ක්‍රි.පූ. **57** වර්ෂයේ දී ය. වර්තමානයේ භාවිත සම්මත වර්ෂ ක්‍රමයට වඩා වසර **57**ක් අධික හෙයිනි. නිදසුනකින් දක්වතොත් ක්‍රි.ව. 2026 වික්‍රම සංවත්සර ක්‍රමයට අනුව 2083 වෙයි. වෛද්‍යගේ අදහස වන්නේ මේ වික්‍රමාදිත්‍ය යනු කාලිදාසගේ අනුග්‍රාහකයා ලෙස සුප්‍රකට වික්‍රමාදිත්‍ය බවත් එනිසා කාලිදාසගේ කාලය ද එයට සමාන බවත් ය. වෛද්‍යගේ මෙම අදහසට සුප්‍රකට භාරතවේදීන් රැසකගේ සහාය ලැබී ඇත. මහාචාර්ය ශාරදාරන්ජන් රායි, ප්‍රයාග් විශ්වවිද්‍යාලයේ සංස්කෘත මහාචාර්ය චට්ටෝපාධ්‍ය සහ මහාචාර්ය ෂෙම්බවනේකර් වැනි විද්වත්හු ඒ අතර සිටිති. (මිරාශි, **05**.). සර් විලියම් ජෝන්ස් පවසන්නේ ද කාලිදාස ක්‍රි.පූ. අවධියක විසූ බව යි. "The poems of Kalidas were composed before the beginning of our era." (Jones, W. 1799. 99.). "We know with as positive certainty, that Amarsinh and Kalidas composed their works before the birth of Christ," (Jones, W. 1799. 347.). කාලිදාස සහ වික්‍රමාදිත්‍ය දෙදෙනාගේ සම්බන්ධතාව සංස්කෘත සාහිත්‍යයෙහි සුප්‍රකට ය. ඒ හා බැඳුණු ඓතිහාසික අගයක් ඇති සහ එබඳු අගයක් නොමැති ප්‍රවාද සිය ගණනකි. වෛද්‍ය මෙහි දී වික්‍රමෝර්වශීය ඇතුළු කාලිදාසගේ කෘතිවල " අනුත්සේකඃ බලු වික්‍රමාලඞ්කාරඃ, දිෂ්ට්‍යා මහේන්ද්‍රෝපකාරපර්යාප්තේන වික්‍රමමහිම්නා වර්ධතේ භවාන්" (වික්‍රමෝර්වශීය ප්‍රථම අඞ්කය) යනුවෙන් කිහිප වරක් ම දැකිය හැකි වික්‍රම යන යෙදුමෙන් වක්‍ර ව සඳහන් කරන්නේ සිය අනුග්‍රාහකයා වන වික්‍රමාදිත්‍ය රජු පිළිබඳ ව යැයි උපකල්පනය කෙරෙයි. සේනේ ඇතුළු පිරිස ද සිය මාලවිකාග්නිමිත්‍ර නාටක සංස්කරණයේ දී මේ පිළිබඳ ධනාත්මක අදහසක් ඉදිරිපත් කරති **(**Sane, 1950**.** 12.**).**

මේ පිළිබඳ ස්වකීය අදහස් ඉදිරිපත් කරමින් මිරාශි පවසන්නේ ක්‍රි.පූ. පළමු සියවසේ වික්‍රමාදිත්‍ය නම් රජකු සිටි බවට තවමත් නිශ්චිත සාක්ෂි නොමැති බව යි (මිරාශි, **1956**. **05**.). හාලගේ ගාථාසප්තසති, ක්ෂේමේන්ද්‍රගේ බෘහත්කථාමඤ්ජරී සහ සෝමදේවගේ කථාසරිත්සාගර වැනි කෘතිවල වික්‍රමාදිත්‍ය නම් රජකු පිළිබඳ සඳහන් වුවත් ඒ පිළිබඳ නිසැක විශ්වාසයක් තැබිය නොහැක්කේ මෙම කෘති පසුකාලීන ව සංස්කරණය වූ බැවින් ය. (බෘහත්කථාමඤ්ජරී සහ කථාසරිත්සාගර කෘති දෙක ක්‍රි.ව. **11** වැනි සියවසට පසු සම්පාදනය වූ අතර ඒවායෙහි මූලය ලෙස සැලකෙන පෛශාචී ප්‍රාකෘතයෙන් රචනා වූ ගුණාඪ්‍යගේ බෘහත්කථාව ක්‍රිස්තු පූර්ව අවධියකට අයත් ලෙස හඳුනාගැනෙයි.) ඒ හැරුණු විට ක්‍රි.පූ. **01** වැනි සියවසේ භාරතයේ පාලකයකු වූ වික්‍රමාදිත්‍ය කෙනකු පිළිබඳ කිසි දු ඓතිහාසික සාක්ෂ්‍යයක් හමු නො වෙයි.

ක්‍රි.පූ. **57** දී ආරම්භ වන වික්‍රම සංවත්සර ක්‍රමය පිළිබඳ මහාචාර්ය කීල්හෝර්න්ගේ අදහස් ද සමලෝචනය කරමින් විෂ්ණු මිරාශි පවසන්නේ මෙම වර්ෂ ක්‍රමය කිසි දු වික්‍රමාදිත්‍යයකු විසින් ආරම්භ නොකළ අතර, පසු කලෙක ක්‍රමයෙන් ඔහුගේ නම ඒ හා සම්බන්ධ වූ බව යි (මිරාශි, **1956**.

**06.**). වික්‍රම වර්ෂය එනම් ලැබීමට හේතුව වනුයේ සරත් ඍතුවේ ආරම්භයේ එනම් කාර්තික මාසයෙන් පටන්ගන්නා මෙම වර්ෂ ක්‍රමයේ ආරම්භක සමය රජවරුන් යුද්ධයට පිටත් වීම සඳහා තෝරාගැනීම යි. වික්‍රම-කාල (යුද සමය) යන්න පසු ව වික්‍රමයන්ගේ හෙවත් වීර ක්‍රියාවන්ගේ කාලය වී තිබෙන්නට ඇත. එයටත් පසු එම යෙදුමේ අර්ථය පටලවාගැනීමෙන් වික්‍රමාදිත්‍යගේ කාලය යන අර්ථාරෝපණයට ලක්වන්නට ඇත. "කාලිදාසට මෙතරම් පැරණි දිනයක් ලබාදීමට පිළිගත හැකි හේතුවක් නැත, සහ එයට දැන් ඉන්දියාවෙන් පිටත බරපතළ ආධාරකරුවෙක් නොමැත." යනුවෙන් කීත් මේ සම්බන්ධයෙන් පවසයි (Keith, 1959**. 143**.).

මෙම වික්‍රම සංවත්සර ක්‍රමයේ ආරම්භය සහ කාලිදාස අතර සබඳතාවක් නොමැති වුවත් කාලිදාස සහ වික්‍රම යන සංඥා නාම අතර ගැඹුරු සම්බන්ධයක් ඇති බවට මෙම විද්වතුන් ඉදිරිපත් කරන කරුණුවල සත්‍යතාවක් ඇති බව පැවසිය යුතු ය.

### 3.4. ක්‍රි.ව. පළමුවැනි සියවස හෝ ආසන්න කාලයක

කාලිදාසගේ සහ අශ්වඝෝෂගේ කාව්‍යවල දැකිය හැකි යම් සමානතා සලකා බැලීමෙන් කාලිදාසගේ කාලය පිළිබඳ මෙම අදහස මතු විය. අශ්වඝෝෂගේ සෞන්දරනන්ද, බුද්ධචරිත යන මහාකාව්‍ය දෙකෙහි සහ කාලිදාසගේ කුමාරසම්භව, රඝුවංශ යන මහාකාව්‍ය දෙකෙහි සන්දර්භමය සහ වර්ණනාත්මක සමානතා කිහිපයක් ම දැකිය හැකි ය. සුන්දරී නන්ද දෙදෙනාගේ සරණ බැඳීම පිළිබඳ කියැවෙන සෞන්දරනන්දය සහ ශිව-පාර්වතී දෙදෙනාගේ මංගල්‍යය විස්තර වන කුමාරසම්භවයත් එලෙස ම ශාක්‍යවංශයේ ඉතිහාසය පැවසෙන බුද්ධචරිත මහාකාව්‍යය සහ රඝු පරම්පරාවේ තොරතුරු පැවසෙන රඝුවංශයත් මූලික තේමාව වශයෙන් සමාන ය. සෞන්දරනන්දයේ 'භාර්යායාචිතක' නම් සවැනි සර්ගයේ පැනෙන සුන්දරී විලාපයේ සහ කුමාරසම්භවයේ 'රතිවිලාප' නම් සිවුවැනි සර්ගයේ රති විලාපයෙහිත් (කුමාරසම්භව, iv. **01-38**) පැවිදි වීමෙන් පසු නන්දගේ ශෝක ප්‍රකාශයන්හි සහ රඝුවංශයේ අටවැනි සර්ගයේ ඉන්දුමතියගේ අභාවයේ අජ ශෝක වීම්වල බොහෝ පොදු ලක්ෂණ දැකිය හැකි ය. බුද්ධචරිතයේ තුන්වැනි සර්ගයේ බෝසත් කුමරු නගරයේ වීථි සඤ්චාරයේ යෙදෙන විට ඔහු දැකගැනීම සඳහා කාන්තාවන් උත්සුක වූ ආකාරයේත් කුමාරසම්භවයේ 'උමාපරිණය' නම් සත්වැනි සර්ගයේ විවාහෝත්සවය සඳහා ඖෂධීයප්‍රස්ථ නගරයට සම්ප්‍රාප්ත වන ශිව දේවයා (කුමාර, vii. **50-69**) සහ රඝුවංශයේ 'අජපාණිපරිග්‍රහ' නම් සත්වැනි සර්ගයේ ඉන්දුමතීගේ ස්වයංවරයෙන් පසු අජගේ නගර ප්‍රවේශ අවස්ථාවේ ඔහු දැකීමට පුරවධූන්ගේ ඖත්සුක්‍යය (රඝු. vii. **04-16**) පිළිබඳ වර්ණනාවල පැහැදිලි සමානකම් නිරීක්ෂණය කළ හැකි ය. රාමායණයේ රාවණ වැනුමට පැහැදිලි සාදෘශ්‍යයක් දක්වන කුමාරසම්භවයේ "තාරක අසුරයා පිළිබඳ වැනුමෙහි ද අශ්වඝෝෂ සිහිපත් කරවන යෙදුම් තිබෙන බැව්" කීත් පවසයි (කීත්, **1965**. **131**.).

මෙම ආකෘතිකමය සහ සන්දර්භීය සමානතා හැරුණු විට කවීන් දෙදෙනාගේ කෘතිවල අදහස්වලින් පමණක් නොව වචනවලින් ද සමානකමක් පැනෙන බව සේනානායක පවසයි (සේනානායක, **1960**. **212**.).

> "තං ගෞරවං බුද්ධගතං චකර්ෂ - භාර්යානුරාගඃ පුනරාචකර්ෂ
>
> සෝ'නිශ්චයාන්නාපි යයෞ න තස්ථෞ **-** තුරංස්තරංගේෂ්විව රාජහංසඃ" (සෞන්දරනන්ද, iv.**42**.)

"මාර්ගාචලව්‍යතිකරාකුලිතේව සින්ධු
ශෛලාධිරාජතනයා න යයෞ න තස්ථෞ" (කුමාරසම්භව, V.85)

"වාතා වවුඃ ස්පර්ශසුඛා මනොඥා - දිව්‍යානි වාසාංස්‍යවපාතයන්ත්‍යඃ
සූර්යඃ ස ඒවාභ්‍යධිකං චකාශේ - ජජ්වාල සෞම්‍යාර්චිරනීරිතො' ග්නිඃ" (බුද්ධචරිතය, i, 41.)

"වාතා වවුඃ සෞඛ්‍යකරාඃ ප්‍රසේදුරාශා විධූමෝ හුතභුග්දිදීපේ
ජලන්‍යභුවන් විමලානි තත්‍රෝත්සවේන්තරීක්ෂං ප්‍රසසාද සද්‍යඃ" (කුමාරසම්භවය, xi, 37.)

"ද්වන්ද්වානි සර්වස්‍ය යතඃ ප්‍රසක්තාන්‍යලාභලාභප්‍රභෘතීනි ලෝකේ
අතෝ'පි නෛකාන්තසුඛො'ස්ති කශ්චිනෛකාන්තදුඃඛඃ පුරුෂඃ පෘථිව්‍යාම්" (බුද්ධචරිතය, xi. **43** )

"නත්වාත්මානං බහුවිගණයන්නාත්මනෛවාවලම්බේ
තත් කල්‍යාණි ත්වමපි නිතරං මා ගමඃ කාතරත්වම්
කස්‍යාත්‍යන්තං සුඛමුපනතං දුඃඛමේකාන්තතො වා
නීචෛර්ගච්ඡත්‍යුපරි ච දශා චක්‍රනෙමික්‍රමේණ" (කාලිදාස, **1916**. මේඝදූත ii, **43**)

මේ එබඳු ස්ථාන කිහිපයකි. මෙම සාදෘශ්‍යතා නිරීක්ෂණය කරන විද්වත්හු මූලික මත දෙකක් ඉදිරිපත් කරති. කාලිදාසගේ කවිවලට වඩා අශ්වඝෝෂගේ කවි කෘත්‍රිම බවින් යුතු ය. සංස්කෘත කාව්‍ය ඉතිහාසයේ කෘත්‍රිම බවින් වැඩි තරමට කවියා වඩාත් නවීන ලෙස සලකනු ලැබෙයි. එනිසා අශ්වඝෝෂ කාලිදාසට පසුකාලීන බවත් ඔහු කාලිදාසගේ නිර්මාණ ඇසුරෙන් සිය රචනා විසිතුරු කරන්නට ඇත. යනු එක් මතයකි. අනෙක් විද්වත් පාර්ශ්වය පවසන්නේ "කාලිදාස අශ්වඝෝෂගේ පරිකල්පනය සහ වචන සැදීම ලබාගෙන එය ඔපදමා ඔහුගේ කවියට ඇතුළත් කර ඇත" යනුවෙනි (මිරාශි, **1956**. **15**.).

කාලිදාස අශ්වඝෝෂයනට පූර්වකාලීන යැයි අදහස් දක්වන්නෝ කාලිදාසගේ කාලය ක්‍රි.ව. පළමුවැනි සියවස හෝ එයට පෙර කාලයකට අයත් කරති. ඒ අශ්වඝෝෂගේ කාලය බොහෝ දුරට නිසැක ව පළමුවැනි සියවසට අයත් කළ හැකි නිසා ය. කුෂාණ වංශික කණිෂ්ක රජ (ක්‍රි.ව. **78-100**) දවස සිදු කළ සිවුවැනි බෞද්ධ ධර්මසංගායනාවෙහි ප්‍රධාන ස්ථානයක් ඉසිලූ අශ්වඝෝෂ පිළිබඳ චීන සහ ටිබෙට් වාර්තා රැසකින් තොරතුරු ලබාගත හැකි ය. නිර්මාණවල සමානකම් පිළිබඳ සාකච්ඡා කරද්දී පැවසිය යුතු විශේෂිත ම කරුණ අශ්වඝෝෂ සහ කාලිදාස දෙදෙනාට ම රාමායණයෙහි බලපෑම ලැබී ඇති බව යි. එසේ වුවත් ඓතිහාසික සහ වාග්විද්‍යාත්මක සාක්ෂ්‍ය අනුව කාලිදාස අශ්වඝෝෂට පසුකාලීන බව නිසැක ය. "පරිපූර්ණත්වයෙන් සහ ඔපමට්ටමෙන් කාලිදාස අශ්වඝෝෂ කෘති පසුබා සිටින බව" පවසන කීත් ධ්වනිත කරන්නේ ද "අශ්වඝෝෂගෙන් කාලිදාස ආභාසය ලබන්නට ඇත." යන්න යි (කීත්, **1965**. **145**.).

### 3.5. ක්‍රි.ව. තෙවැනි සියවස

"බීජාපූර්හි ප්‍රසිද්ධ ජ්‍යොතිශ්ශාස්ත්‍රඥ ශ්‍රී ඩී.වී. කෙට්කාර්, කාලිදාස ක්‍රි.ව. **280** දී පමණ ජීවත් වූ බවට යෝජනා කර ඇත" (මිරාශි, **1956**. **21**). මෙම මතය පහත ජ්‍යොතිශ්ශාස්ත්‍රීය සාධක මත පදනම් වේ. රඝුවංශයේ සොළොස්වැනි (xvi) සර්ගයේ **43** සහ **44** යන පද්‍ය දෙකෙන් කියැවෙන්නේ ග්‍රීෂ්ම ඍතුව

උදාවීම (ආජගාම ඝර්මඃ) සහ අගස්ති සලකුණ ලැබූ අයනයෙන් හෙවත් 'දක්ෂිණායනයෙන්' සූර්යයා ආපසු උතුර බලා ගමන් ඇරඹීමෙන් උතුරු දිශාව ප්‍රීති වූ ආකාරය යි.

**"अथास्य रत्नग्रथितोत्तरीयमेकान्तपाण्डुस्तनलम्बिहारम् ।**

**निःश्वासहार्यांशुकमाजगाम घर्मः प्रियावेषमिवोपदेष्टुम् ॥ १६ -४३॥**

**अगस्त्यचिह्नादयनात्समीपं दिगुत्तरा भास्वति संनिवृत्ते ।**

**आनन्दशीतामिव वाष्पवृष्टिं हिमस्रुतिं हैमवतीं ससर्ज ॥" १६ -४४॥**(Acharya, 1948. 411.)

මෙහි **44** වැනි පද්‍යයේ **"अगस्त्यचिह्नादयनात्"** යන යෙදුමට අනුව, දක්ෂිණායනයේ අවසානයේ එනම් මකර නිවර්තන රේඛාවට සම්ප්‍රාප්ත වන අවස්ථාවේ සූර්යයා කන්‍යා (Virgo) රාශියේ සහ සිත (Chitra) නැකතේ දීප්තිමත් ම තාරකාව වන 'අගස්ති තාරකාවෙහි හෙවත් ඛගෝලයේ අංශක **90** ස්ථානයේ සිටි බව අදහස් වෙතැයි' කෙට්කර් පවසයි. වරාහමිහිරට අනුව ක්‍රි.ව. **520** දී දක්ෂිණායනයේ දී සූර්යයා පුනාවස නැකතේ, එනම් අංශක **86** කලා **40** යන ස්ථානයේ සිටියේ ය. වරාහමිහිරගේ බෘහත්සංහිතාවේ සහ තාරකා ශාස්ත්‍ර නියම අනුව අගස්ති තාරකාවේ පිහිටීම අස්විද නැකත ආරම්භයේ සිට අංශක අනූවක් බව කියනු ලැබේ. අංශක **13**ක් සහ කලා **20**ක් වන එක් නක්ෂත්‍රයක[1] සූර්යයාගේ පිහිටීම වෙනස් වීමට හෙවත් හරහා යෑමට වසර **960** ක් ගත වේ. එවිට අංශකයක් ගමන් කිරීම සඳහා ගත වන්නේ වසර **72**ක කාලයකි. කේට්කර්ට අනුව කාලිදාස අදහස් කළ අවස්ථාවේ වරාහමිහිර පවසන අවස්ථාවට වඩා අංශක **03**ක් හා කලා **20**ක වෙසකින් එනම් අංශක 90 ස්ථානයේ දක්ෂිණායන සූර්යයා පිහිටියේ ය. එම කාලය වර්ෂවලින් මිනිය හොත් අවුරුදු **240**කි. ඒ අනුව අවස්ථා දෙකේ වෙනස සැසඳීමෙන් කාලිදාස ක්‍රි.ව. තුන්වන සියවසේ අග භාගයේ එනම් ක්‍රි.ව. **280** (**520-240 = 280**) පමණ ජීවත් වූ බව කෙට්කර් මහතා ගණන් බලයි.

මෙම මතයට ප්‍රතිතර්ක දෙකක් ඉදිරිපත් ව ඇත. පළමුවැන්න නම් මෙම පද්‍යයේ දී කාලිදාස අගස්ති තරකාව අදහස් නොකළ අතර, දකුණේ විසූ සුප්‍රකට අගස්ති මුනිවරයාගේ නමින් දකුණු දිශාව අන්වර්ථ ව හැඳින්වූ බව යි. 'අගස්ති චිහ්නාත් අයනාත්' යන වදන්වලින් ඔහු දක්ෂිණායනය අදහස් කරන්නට ඇත.

දෙවැන්න මෙවැනි ජ්‍යොතිර් විද්‍යාත්මක සංසිද්ධියක් දැක්වීමට අවශ්‍ය වූයේ නම් එය නිශ්චිත ආකාරයකින් පැවසීමට කාලිදාසට දැනුම හා ශක්‍යතාව පැවති බවත් ඒ සඳහා ඔහු එම යුගයේ වාසය කිරීම අනිවාර්ය සාධකයක් නොවන බවත් ය. නිදසුනක් ලෙස ක්‍රි.ව. **400** දී පමණ කාලිදාස විසූ බව සලකතොත් එයට වසර **120**කට පෙර වූ මෙබඳු සිදු වීමක් කාලිදාස සතු ශාස්ත්‍රීය දැනුම අනුව විස්තර කිරීමට හැකි ය. කාලිදාස ගුප්ත යුගයට හෝ වෙනත් කාලයකට අයත් කිරීම වැළකීමට තරම් මෙය ප්‍රබල සාධකයක් නො වෙයි.

### 3.6. ක්‍රි.ව. පස්වැනි සියවස

රඝුවංශයේ සිවුවැනි සර්ගයේ රඝුගේ සංග්‍රාමවිජය පිළිබඳ වර්ණනයේ දී සින්ධු නදී තීරයේ දී හූණයන් පැරදවීම පිළිබඳ කාලිදාස ඉදිරිපත් කරන පහත සඳහන් පද්‍ය ඇසුරෙන් මහාචාර්ය පතක් ඇතුළු විද්වත් පර්ෂදයක් මෙම අදහස් ඉදිරිපත් කොට ඇත.

---

[1] පෘථිවිය වටා නැකැත් තරු විසිරී ඇති අවකාශ ගෝලය ඛගෝල නම් වෙයි. පෘථිවිය කේන්ද්‍රකොට ගත් විට ඛගෝලයේ අංශක **360** නැකත් සංඛ්‍යාව වන 27න් බෙදූ විට එක් නැකතක පරාසය අංශක **13**ක් සහ කලා **20**ක් වෙයි.

'තතඃ ප්‍රතස්ථේ කෞබේරිං භාස්වානිව රඝුර්දිශම්.

ශරෛරුස්‍රෛරිවෝදීච්‍යානුද්ධරිශ්‍යන්රසානිව' (රඝුවංශ, iv, **66.**)

**'**තම රශ්මීන් මඟින් තෙතමනය උරාගැනීම සඳහා හිරු උතුරු දෙසට ගමන් කරන ආකාරයට රඝු රජ, උතුරු දිග රජවරුන් තම ඊතල මඟින් බිඳ දැමීමට ඇති ආශාවෙන් කුබේර දිග (උතුර) දෙසට ගමන් කළේ ය.'

විනීතාද්වශ්‍රමාස්තස්‍ය සින්ධුතීරවිචේෂ්ටනෛඃ.

**'**දුධුවුර්වාජිනඃ ස්කන්ධාල්ලග්නකුඞ්කුමකේසරාන්. (රඝුවංශ, iv, **67.**)

'සින්ධු නදී තීරයේ පෙරළීමෙන් ගමන් වෙහෙසින් සුවපත් වූ ඔහුගේ අශ්වයෝ, කුංකුම රේණු ඇලුණු උරතල සෙල්ලූහ.'

තත්‍ර හූණාවරෝධානං භර්තෘෂු ව්‍යක්තවික්‍රමම්.

කපෝලපාටලාදේශි බභුව රඝුචේෂ්ටිතං. (රඝුවංශ, iv, **68.**)

**'**එහි දී හූණ ජාතික ස්ත්‍රීන්ගේ ස්වාමිපුරුෂයන් උදෙසා ප්‍රදර්ශනය කරන ලද පරාක්‍රමය ඇති රඝු රජුගේ වික්‍රම, ඔවුන්ගේ (හූණ ස්ත්‍රීන්ගේ) කොපුල් රතු පැහැයට දායකයක් විය.

මෙම පද්‍යාවලින් විස්තර වන රඝු රජුගෙන් පැරදි හූණයෝ ක්‍රි.ව. **450** දී පමණ නැවත වරක් ඔක්සස්ගං ඉවුරේ තම රාජධානිය පිහිටුවා ඉන්දියාව ආක්‍රමණය කළහ. ඒ කුමාරගුප්තගේ අවසාන කාලයේ දී ය. ඔහුගේ කිරුළේ හිමිකරු වූ ස්කන්ධගුප්ත හූණවරුනට නිර්භීත ව මුහුණදුන්නේ ය. ක්‍රි.ව. **455-456** පමණ ධූනාඝඞ්හි පිහිටවූ සෙල්ලිපියෙන් **(**The Junagadh inscription is a large rock in Gujarat featuring three sets of inscriptions: the Major Rock Edicts of Ashoka (c. **250** BCE), a Sanskrit inscription by Rudradaman I (c. **150** CE), and another by Skandagupta (c. **450** CE) මෙය සනාථ වේ. ශිලා ලේඛනයෙන් විස්තර වන අවස්ථාව ඇසුරින් කාලිදාස රඝුවංශයේ රඝු විසින් හූණයන් පැරදවීම විස්තර කරන හෙයින් කාලිදාස පස්වන සියවසේ මැද භාගයේ දී හෝ ඉන් පසු ජීවත් වූ බව මෙම මතය ඉදිරිපත් කරන්නෝ පවසති.

මේ පිළිබඳ මිරාශි පවසන්නේ "ක්‍රි.පූර්ව යුගයේ පටන් ම භාරතීයයන් දැන සිටි හූණයන් පිළිබඳ දැනගැනීමට කාලිදාසට ක්‍රි.ව. පස්වැනි සියවස තෙක් බලා සිටින්නට අවශ්‍ය නොවන බවත් එනිසා ම කාලිදාසගේ කාලය පස්වැනි සියවසේ මැද භාගය දක්වා මෑතට ගෙන ඒමට අවශ්‍යතාවක් නොමැති බවත්" ය (මිරාශි, **1956. 24.**).

මහාභාරතයේ භීෂ්ම පර්ව සහ ශාන්ති පර්ව යන පරිච්ඡේදවල හූණයන් පිළිබඳ සඳහන් වේ. මෙම කොටස්වල දී ඔවුන් බොහෝ විට හිමාලයට උතුරින් පිහිටි රාජ්‍යයක ම්ලේච්ඡ ගෝත්‍රිකයන් ලෙස, චීන, තුඛාර **(**Tukhara) සහ දාරද **(**Darada) වැනි අනෙකුත් ගෝත්‍ර සමඟ එකට ලැයිස්තුගත කර ඇත. කුරුපාණ්ඩව මහාසංග්‍රාමය සඳහා දෙපසට බෙදී රැස් ව සිටි භාරතීය සහ ඉන් බැහැර ජනවර්ග පිළිබඳ විස්තරයක දී ම්ලේච්ඡ ජන කොටසක් ලෙස යුධිෂ්ඨිරගේ පාර්ශ්වයට සම්බන්ධ වූ හූණවරුන් පිළිබඳ පැවසෙයි. **"**Among the tribes of the north are the Mleechas, and the Kruras, O best of the Bharatas; the Yavanas, the Chinas, the Kamvojas, the Darunas, and many Mleccha tribes ; the Sukritvahas, the Kulatthas, the Hunas, and the Parasikas; the Ramanas, the Chinas, and the Dasamalikas. (Roy, P. C.**,** 1886**.** 24.). මෙයට අමතර අවස්ථා කිහිපයක දී ම මහාභාරතය හූණයන් පිළිබඳ සඳහන් කරයි**.**

ක්‍රි.ව. තුන්වන සියවසේ පමණ ලියැවුණැයි සැලකෙන ලලිතවිස්තරය ද බෝසතාණන් වහන්සේ ළමා කාලයේ උගත් අක්ෂර අතර හූණ අක්ෂරමාලාව සඳහන් කරයි. **“**Which script, O master, will you be teaching me? [F.66.b] Will it be the Brāhmī script, **...**the Cīna script, the Lūna script, the Hūṇa script **...” (**Dharmachakra Translation Committee, 2013**. 91**.). මෙබඳු ඉපැරණි වෘත්තාන්ත පවතින විට හූණයන් පිළිබඳ කියවීමකට පස්වැනි සියවස පසු වන තුරු සිටීමට කාලිදාසට සිදු වුණැයි පැවසීම පදනම් රහිත දෙයකි.

**3.7. ක්‍රි.ව. සවැනි සියවස**

කාලිදාසගේ කාලය පිළිබඳ සාකච්ඡාවේ දී එය ක්‍රිස්තු වර්ෂ සවැනි සියවස බව පැවසෙන අදහස් කිහිපයක් ම වෙනස් වෙනස් හේතු පදනම් කොට ඉදිරිපත් වී තිබෙයි. එහි මත සතරෙකි.

i. ඓතිහාසික මූලාශ්‍රය තොරතුරුවල ව්‍යාකූලතා හේතු කොටගෙන ක්‍රි.ව. **544** දී මාලව දේශය පාලනය කළ යශෝධර්මන් රජු වික්‍රමාදිත්‍ය රජු ලෙස හඳුනාගැනීම

ii. දක්ෂිණාවර්තනාථ (ක්‍රි.ව. දොළොස්වන ශතවර්ෂය) සහ මල්ලිනාථ (ක්‍රි.ව. දහහතරවැනි ශතවර්ෂය) වැනි පසුකාලීන ටීකාකරුවන් මේඝදූතයේ පාඨයකට විස්තර සපයමින් දිඞ්නාග පිළිබඳ කරන සඳහන පදනම් කොට

iii. කාලිදාසගේ කෘතිවලින් හමුවන කාල සංකේත ඇසුරින් තාරකා විද්‍යාත්මක කරුණු මත

iv. වරාහමිහිරගේ ජීවන සමය හා සම්බන්ධ ග්‍රන්ථාන්තරාගත තොරතුරු පදනම් කොට

i. 'කාලිදාස ක්‍රි.ව. සවැනි සියවසේ ජීවත්වුණි' යන මතය ඉදිරිපත් කළ නූතන විද්වතුන් අතුරින් මැක්ස් මුලර් ප්‍රධාන වෙයි. ඔහු පවසන්නේ භාරතයේ සංස්කෘත අධ්‍යාපනය සහ බ්‍රාහ්මණ ඉගැන්වීම්වල පුනරුදය ඇති වූයේ ක්‍රි.ව. සවැනි සියවසේ බවත් ඒ නිසා කාලිදාසගේ කාලය මෙම අවධියේ විය යුතු බවත් ය. ගුප්ත යුගයටත් පෙර සිට සංස්කෘත භාෂා සාහිත්‍යයේ නැඟීම සහ බ්‍රාහ්මණ ආධිපත්‍යය තහවුරු වීම යන කරුණු අනාවරණය වීමත් සමග මැක්ස් මුලර්ගේ අදහස ප්‍රතික්ෂේප විය. ඒ සමග ම හියුං සියැංගේ (Xuanzang, 602–664 CE) සහ රාජතරඞ්ගිණී කර්තෘ කල්හණගේ කෘතිවලින් හෙළි වූ යම් කරුණක් මත නැවත කාලිදාසගේ කාලය සවැනි සියවසට අයත් බවට වූ සාකච්ඡාව විද්වතුන් කිහිප දෙනකුගේ දායකත්වයෙන් ඉදිරියට ආවේ ය. ක්‍රි.ව. **530** සහ **580** අතර කාලයේ යශෝධර්මන් හෙවත් ශිලාදිත්‍ය විසින් මාලවය පාලනය කළේ යැයි හියුං සියැංග් පවසයි. කල්හණ රාජතරඞ්ගිණියෙහි දී මෙයට සමකාලීන යශෝධර්මන් හෙවත් වික්‍රමාදිත්‍ය නම් රජකු උජ්ජයිනියෙහි පාලකයා වූ බවත් ඔහු තම පාසල් මිතුරා හා කවියා වන මාතෘගුප්ත කාශ්මීරයේ සිහසුනේ තැබූ බවත් පවසයි. මෙහි මාතෘගුප්ත යනු කාලිදාස ය යනු උක්ත පර්ෂදයේ මතය යි. මේ පිළිබඳ අදහස් දක්වන Paradkar පවසන්නේ "මෙම හඳුනාගැනීම් සියල්ල සැක සහිත බවත් කල්හණගේ රාජතරංගිණිය තත්කාලීන තොරතුරුවල දී විශ්වසනීය වුවත් ඓතිහාසික ව විශ්වාසයට තරම් නොවන බවත්" ය **(**Paradkar, M.D. **2014. 12**.**).**

"ක්‍රි.ව. **544** දී සිදු වූ කෝරුර් යුද්ධය" ඓතිහාසික වාර්තාවල ද සඳහන් වන ඉන්දියානු රජකු විසින් ආක්‍රමණික ශක ජාතිකයනට එරෙහිව ලබාගත් ජයකි. එය ජර්මානු පර්යේෂක මැක්ස් මුලර් වැනි විද්වතුන් විසින් වික්‍රමාදිත්‍ය රජුගේ ප්‍රසිද්ධ පරම්පරාව සමග සම්බන්ධ කර ඇත **(**Paradkar, M.D. **2014. 12.).** මෙම සිදුවීම සහ එහි හඳුනාගැනීම් ගැටලු සහගත වෙයි. මැක්ස් මුලර් පවසන "

කෝරූර්" නම් ස්ථානය නිශ්චිත ව හඳුනාගෙන නොමැත. එය වර්තමාන ඉන්දියාවේ මධ්‍ය ප්‍රදේශ් හෝ ගුජරාටය ආශ්‍රිත ප්‍රදේශයක් ලෙස සැලකේ. යශෝධර්මන් රජු සවැනි ශතවර්ෂයේ මාලව ප්‍රදේශය පාලනය කළ අතර ඔහුගේ බලය පිළිබඳ සාක්ෂි ලෙස මන්දසෝර්හි ශිලාලේඛන දක්නට ලැබේ. ඔහු යුද්ධ කළ බව සඳහන් වන්නේ ශක ජාතිකයනට එරෙහිව නොව හූණයනට එරෙහි ව ය. එම යශෝධර්මන් සමග වික්‍රමාදිත්‍ය සම්බන්ධ කිරීම ද බොහෝ නවීන ඉතිහාසඥයන් විසින් ප්‍රතික්ෂේප කොට ඇත. "කල්හණ, මාතෘගුප්ත කවියාගේ පාලන සමය සම්බන්ධයෙන් උජ්ජයිනියේ මහා වික්‍රමාදිත්‍ය-හර්ෂ ගැන කරන සඳහන, ඒ හා සමාන විශාලත්වයකින් යුත් කාලානුක්‍රමික දෝෂයක් හෙළි කරන බව" රාජතරඞ්ගිණී සංස්කරණය කොට ඉංග්‍රීසියට පෙරළූ ස්ටේයින් පවසයි (Stein, 1900. 65.)**.**

මෙම තොරතුරුවලට අනුව වික්‍රමාදිත්‍යගේ ප්‍රසිද්ධ පුරාවෘත්තය ඓතිහාසික රජකු වන යශෝධර්මන් සමඟ සම්බන්ධ කරමින් කාලිදාසගේ කාලය යශෝධර්මන්ගේ කාලයට අයත් කිරීමට ගත් මෙම උත්සාහය ඉන්දියානු ඉතිහාසඥ විද්වත් පර්ෂදයේ බහුතරයක් විසින් නොපිළිගත් මතිභ්‍රමයක් වෙයි.

ii. කාලිදාසගේ කාලය පිළිබඳ විමසන විද්වතුන්ගේ අවධානය යොමු වූ විශේෂ ස්ථානයක් ලෙස මේඝදූතයේ පූර්ව මේඝයේ දහහතරවැනි පද්‍යය සඳහන් කළ හැකි ය. ඒ දක්ෂිණාවර්තනාථ (ක්‍රි.ව. දොළොස්වවැනි ශතවර්ෂය) සහ මල්ලිනාථ (ක්‍රි.ව. දහහතරවැනි ශතවර්ෂය) යන පසුකාලීන ටීකාකරුවන් එයට විවරණ සපයමින් නිචුල සහ දිඞ්නාග යන පුරාණාචාර්ය දෙපළ පිළිබඳ සඳහන් කිරීම නිසා ය.

"අද්‍රේඃ ශෘඞ්ගං හරති පවනඃ කිං ස්විදිත්‍යුන්මුඛීභිර්
දෘෂ්ටෝත්සාහශ්චකිතචකිතං මුග්ධසිද්ධාඞ්නාභිඃ
ස්ථානාදස්මාත් සරසනිචුලාදුත්පතෝදඞ්මුඛඃ ඛං
දිඞ්නාගානාං පථි පරිහරන් ස්ථූලහස්තාවලේපාන්**"** (මේඝදූත, පූර්වමේඝය, **14** පද්‍යය)

මෙහි මේඝයට කවියා දෙන චිත්‍රකූටය මුදුනෙහි ලැගුම්ගෙන අලකාව කරා පිටත් වීමට උතුරු දිග බලා අහසට නගින්න යන උපදේශය ඇතුළත් වෙයි. "සුළඟ චිත්‍රකූට පර්වත මුදුන ගෙනයන්නේ දෝ යි සැකයෙන් උඩ බලා ගත් මුහුණ ඇති බොළඳ සිදඟනන් විසින් චකිත ආකාරයෙන් දක්නා ලද උඩට නැඟීම් ඇත්තෙහි, මාර්ගයන්හි දිගැතුන්ගේ (දිඞ්නාගානාං) මහත් වූ සොඬ නිසා උපන් ගර්වයන් දුරු කරමින් දිය සහිත තෙත් වූ දිය මිදෙල්ල ගස් (නිචුල) ඇති මේ ස්ථානයෙන් උතුරු දිග් බලා අහසට නගින්න." යනු එහි අරුත යි.

මෙහ **'**දිඞ්නාග සහ නිචුල' යන යෙදුම්වලින් ද්විතීය අර්ථයක් ධ්වනිත වෙතැයි මල්ලිනාථ පවසයි. **"अत्रेदमप्यर्थान्तरं ध्वनयति- रसिको निचुलो नाम महाकविः कालिदासस्य सहाध्यायी परापादितानां कालिदासप्रबन्धदूषणानां परिहर्ता यस्मिन्स्थाने तस्मात्स्थानादुदङ्युखो निर्दोषत्वादुन्नतमुखः सन्पथि सारस्वतमार्गे दिङ्गागानाम् ॥ पूजायां बहुवचनम् ॥ दिङ्गागाचार्यस्य कालिदासप्रतिपक्षस्य हस्तावलेपान्हस्तविन्यासपूर्वकाणि दूषणानि परिहरन् ॥"** (Śarman, V. (Ed.) 1922. **12**.). 'මෙහි දී (කවියා) තවත් අර්ථයක් ඇඟවුම් කරයි. 'රසිකයකු වූ නිචුල නම් මහාකවියා, කාලිදාසගේ ශිෂ්‍යයා (සහ අධ්‍යයන හවුල්කරු) අන් අය විසින් කියන ලද කාලිදාසගේ ග්‍රන්ථවල දෝෂ ප්‍රතික්ෂේප කරන අතර ඒ ස්ථානයේ සිට (තර්කයෙන්) ඉහළට පැමිණ, නිදොස් බව නිසා ඔහුගේ මුහුණ උස් කරගනිමින්, සාරස්වත මාර්ගයේ (විද්වත් සංවාදවල) ගමන් කළේ ය. දිඞ්නාගානාං ලෙස බහුවචනය ගරු කිරීම සඳහා යොදා ඇත. නිචුල දිඞ්නාගාචාර්යයන්ගේ එනම් කාලිදාසගේ විරුද්ධවාදියාගේ හස්තාවලේප, එනම් ඔහු විසින්

ඉදිරිපත් කරන ලද දෝෂ නිරාකරණය කරමින් (සිය ගමන) කළේ ය.' මේ මල්ලිනාථ උක්ත පද්‍යයට ලබාදුන් ද්විතීයික විවරණයේ අරුත යි.

දිඞ්නාග යන්නෙන් ධ්වනිත ද්විතීය අර්ථය කාලිදාසගේ නිර්මාණවල දොස් දක්වමින් විවේචනය කළ පසමිතුරු ආකල්පයක් සහිත දිඞ්නාග ආචාර්යයන් බවත් නිචුල යනු කාලිදාසගේ රසිකයා ලෙසත් හඟවයි. දිඞ්නාග ආචාර්යයන් ඉදිරිපත් කළ විවේචන පරදවමින් කාලිදාස වෙනුවෙන් පෙනී සිටි නිචුල පණ්ඩිතයන් විද්වත් සභාවල හිස කෙළින් කොට සිටි ආකාරය මෙයින් ධ්වනිත වන බවත් මල්ලිනාථ වැඩිදුරටත් ප්‍රකාශ කරයි. ගෞරවාර්ථයෙහි බහුවචන පදයක් යොදා හඳුන්වන දිඞ්නාග යනු බෞද්ධ තර්ක ශාස්ත්‍රයේ ප්‍රවර්ධකයා ලෙස සැලකිය හැකි විශිෂ්ට දාර්ශනිකයා ය. ඔහුගේ කාලය ක්‍රි.ව. පස්වැනි ශතවර්ෂයේ මධ්‍ය භාගයේ සිට සවැනි ශතවර්ෂයේ මුල් භාගය දක්වා වෙයි. එය වඩාත් නිසැක ව සඳහන් කළ හොත් ක්‍රි.ව. 480 - 540 පමණ වෙයි.

මල්ලිනාථ පවසන ආකාරයට බෞද්ධ ආචාර්ය දිඞ්නාගපාද ධ්වනිත වන ශ්ලේෂාර්ථයක් කාලිදාස සිය පද්‍යයෙහි ගැබ් කළේ නම් ඔහුගේ කාලය නිසැක ව ක්‍රි.ව. සවැනි සියවස හෝ ඉන් පසු අවධියක් වෙයි. කාලිදාසගේ කාලය සවැනි සියවසට අයත් වීමේ මෙන් ම මල්ලිනාථයන්ගේ අර්ථ කථනය නිවැරදි වීමේ සම්භාවිතාව අඩු ය. ඒ පිළිබඳ අදහස් දක්වන කීත් මූලික කරුණු තුනක් පදනම් කොට ගෙන සිය විරෝධය ඉදිරිපත් කරයි.

"පළමු ව මෙම අදහස ඉදිරිපත් කර ඇත්තේ දක්ෂිණාවර්තනාථ (ක්‍රි.ව. දොළොස්වන ශතවර්ෂය) සහ මල්ලිනාථ (ක්‍රි.ව. දහහතරවැනි ශතවර්ෂය) වැනි මේඝදූතයේ පසුකාලීන ටීකාකරුවන් විසිනි. වල්ලභරාජ (ක්‍රි.ව. දසවැනි ශතවර්ෂය) වැනි මුල්කාලීන ටීකාකරුවන් විසින් නො වේ. දෙවනු ව, මෙවන් ශබ්දාර්ථ සූක්ෂ්මතා (පද ව්‍යාජ) කාලිදාසගේ රචනා ශෛලියට ගැළපෙන්නේ නො වේ. තෙවනු ව, දිඞ්නාග යනු දාර්ශනිකයකු වූ අතර, කවීන්ගේ කෘතිවල දෝෂ සෙවීමට ඔහු නැඹුරු නොවන්නට ඇත. මේ කවියා අදහස් නොකළ දෙයක් විචාරකයන් විසින් දුටු අවස්ථාවක් විය හැකි ය." කීත් මෙසේ පවසමින් මෙම අදහස ප්‍රතික්ෂේප කරයි **(**Keith**,** 1959. *The Sanskrit Drama***. 145)**.

iii. කාලිදාසගේ කෘතිවලින් හමු වන ජ්‍යොතිර්විද්‍යාත්මක කාල ඇසුරින් තාරකා විද්‍යාත්මක කරුණු මත මහාචාර්ය පී. සී. සේන්ගුප්තා කාලිදාස සවැනි සියවසට අයත් බව නිගමනය කරයි. " මේඝදූතයේ යක්ෂයා ආෂාඪ (ජූනි-ජූලි) මාසයේ අවසන් දින රාමගිරියෙහි මේඝයක් දුටු අතර, මෙය වර්ෂා ඍතුව ආරම්භ වන අවස්ථාව විය. ඔහුගේ ශාපය අවසන් වීමට තවත් මාස සතරක කාලයක් ඇති අතර ඒ කාර්තික (ඔක්තෝබර්-නොවැම්බර්) මාසයේ එකොළොස්වැනි චන්ද්‍ර දිනයේ දී ය. මෙයින් අදහස් වන්නේ යක්ෂයා වැස්ස දුටුවේ චන්ද්‍ර ආෂාඪ මාසයේ ශුක්ල පක්ෂයේ එකොළොස්වැනි දිනයේ දී බව යි. එදින සූර්ය ආෂාඪ මාසයේ අවසන් දිනය වූ අතර, " ප්‍රත්‍යාසන්නේ නභසි" යනුවෙන් හැඳින්වෙන ග්‍රීෂ්ම ඍතුවේ අවසානය (ග්‍රීෂ්මාන්ත සංක්‍රාන්තිය) ද විය. තාරකා විද්‍යාත්මක ව මෙම කොන්දේසි තුන ම සපුරාලිය හැක්කේ ක්‍රි.ව. **541** ජූලි **20** වැනිදාට ය" (Sengupta, P. C. **1947**. **268**.)

ඔහු මෙහි ලා ඉදිරිපත් කරන දෙවැනි සාධකය ශාකුන්තල නාට්‍යයේ VII අංකයේ **22** වැනි පද්‍යය යි.

**"स्मृतिभिन्नमोहतमसो दिष्ट्या प्रमुखे स्थितासि मे सुमुखि ।**

**उपरागान्ते शशिनः समुपगता रोहिणी योगम्॥२२॥ (ශාකුන්තල VII . 22)**

එම පද්‍යයේ "එම්බා සුවදන, (නැවත පැමිණි) ස්මෘතිය නිසා පහ වැ ගිය මෝහාන්ධකාරය ඇති මා අබිමුව වාසනාවකට ඔබ සිටින්නෙහි ය. චන්ද්‍රග්‍රහණය අවසානයේ රෙහෙණ නැකත සඳු හා එක් වීම

සිදු කළා" (මාරසිංහ, **2021**. **350**.), යන අරුත වෙයි. පළමුවැනි අර්ධයෙන් සිය මතකය ගිලිහී යැමත් අනතුරු මෝහයෙන් මිදීම සමග ම ශකුන්තලා සමග එක් වීමත් පිළිබඳ දුෂ්‍යන්තගේ ප්‍රීතිය ප්‍රකාශ කරන කාලිදාස දෙවැනි අර්ධයෙන් අර්ථාන්තරයක් ඉදිරිපත් කරමින් එම හමුව චන්ද්‍රග්‍රහණයක අවසානයේ චන්ද්‍රයා රෝහිණී නක්ෂත්‍රය (**Aldebaran, α Tauri**) සමග එක් වීම වැනි බව පවසයි. තාරකා විද්‍යාත්මක නියම අනුව, මෙලෙස චන්ද්‍රග්‍රහණයක් අවසාන වූ අවස්ථාවේ චන්ද්‍රයා රෝහිණී නක්ෂත්‍රය සමග එක් වූයේ ක්‍රි.ව. **542** නොවැම්බර් **18** වැනිදා බව ගුප්තා නිසැක ලෙස පවසයි. කාලිදාස සිය කාව්‍යෝක්තිය සකසාගන්නේ මෙම සංසිද්ධිය නිරීක්ෂණය කොට යැයි උපකල්පනය කරන මහාචාර්යවරයා එම හේතුව නිසා කාලිදාසගේ කාලය සවැනි සියවසේ මධ්‍යභාගයට අයත් බව නිශ්චය කරයි (**Sengupta, P. C. 1947. 270.**).

කාල නිර්ණය සඳහා පදනම් කරගත් මෙම හේතු දෙක ම උක්ත කරුණ සාධනය කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව විද්වත් මතය යි. සෙන්ගුප්තා ඉදිරිපත් කරන පළමුවැනි මතය විමසන ප්‍රාමාණිකයන් පවසන්නේ කාලිදාස විසින් කිසි දු ස්ථානයක සූර්ය මාස ක්‍රමයක් පිළිබඳ සාකච්ඡා කොට හෝ අවධානය යොමු කොට නොමැති බව යි. එසේ තිබිය දී චන්ද්‍ර සහ සූර්ය මාස දෙකක දිනවල වෙනස සහ ඒ හා සම්බන්ධ සූර්ය සංක්‍රාන්තියක් පදනම් කොට සිදු කළ මෙම ගණනය කිරීම් සඳහා දත්ත ප්‍රමාණවත් නොවන අතර කල්පිතයක් සත්‍යය බවට පත් කිරීමේ තැතක් පමණක් විද්‍යමාන වෙයි.

දෙවැනි මතයට පදනම වන ශාකුන්තලයේ පද්‍යයෙන් මූලික ව පෙනී යන්නේ ආකර්ෂණීය දසුනක් ලෙස පිළිගෙන ඇති රෝහිණී සමඟ චන්ද්‍රයාගේ සංයෝගයත් එහි විචිත්‍රත්වය තීව්‍ර කරන ග්‍රහණය පිළිබඳ අදහසත් ප්‍රස්තුතයෙහි ගැළපීම කාලිදාසගේ කාව්‍ය කුසලතාවට නිදසුනක් බව යි. ඒ හැරුණු විට නවීන මෙවලම් භාවිත කරමින් සිදු කළ ගණනය කිරීම්වල දී තාරකා විද්‍යාත්මක ව ක්‍රි.ව. **542** නොවැම්බර් **18** වැනි දිනයේ සිදු වූ චන්ද්‍රග්‍රහණය සහ චන්ද්‍ර-රෝහිණී යෝගය යන සිදුවීම් දෙක ගණිතමය වශයෙන් නිර්බාධක ව සාධනය කළ හැකි වෙයි. එලෙස ම සැම මසකට ම වරක් චන්ද්‍රයා රෝහිණී නක්ෂත්‍රය සමග සංයෝග වන අතර පූර්ණ චන්ද්‍රයාගේ රෝහිණී සංගමය වසරකට වරක් සිදු වෙයි. තාරකා විද්‍යාත්මක ගණනය කිරීම් අනුව සාමාන්‍යයෙන් සැම වසරක ම චන්ද්‍රග්‍රහණ දෙකක් පමණ සිදු වන අතර සියවසකට කිහිප වරක් චන්ද්‍රග්‍රහණයකින් අනතුරු ව චන්ද්‍ර රොහිණී සුසංයෝගය සිදු විය හැකි බව පෙනී යයි. එම ගණනය කිරීම් අනුව **357**, **459**, **542** වසරවල ද මෙවැනි සංසිද්ධි සිදු වී ඇත. ක්‍රි.ව. **357** සැප්තැම්බර් **16** වැනිදා සිදු වූයේ සම්පූර්ණ චන්ද්‍රග්‍රහණයකි. (Total Lunar Eclipse) මෙය ඉතිහාසයේ අඳුරු කාල පරිච්ඡේදයක සිදු වූවක් නිසා සවිස්තර වාර්තා අඩු ය. NASA-හි දත්ත සහ ග්‍රහචාරය පිළිබඳ මෘදුකාංග (Planetarium Software) මඟින් පරීක්ෂා කරන විට, මෙම ග්‍රහණය අවසන් වන විට චන්ද්‍රයා වෘෂභ රාශියේ (Taurus) පිහිටා තිබූ බව පෙනේ. රෝහිණී නක්ෂත්‍රය මෙම රාශියේ ම පිහිටා ඇති බැවින්, ග්‍රහණාවසානයේ දී චන්ද්‍රයා රෝහිණී නක්ෂත්‍රයට අතිශයින් ආසන්න ව හෝ එහි පිහිටා තිබීමේ ඉතා ඉහළ සම්භාවිතාවක් ඇත. ආචාර්ය ගුප්තා පවසන පරිදි කාලිදාස ශාකුන්තලයේ දී ඉදිරිපත් කරන්නේ සිය අනුභූතියක් නම් ඔහුගේ කාලය මෙම අවස්ථාව සමග සම්බන්ධ කිරීම වඩාත් උචිත ය. ඒ කාලිදාසගේ ගුප්ත යුගය හා සම්බන්ධය වඩාත් පිළිගත් මතය හෙයිනි.

iv. කාලිදාසගේ කෘතියක් ලෙස හැඳින්වෙන "ජ්‍යෝතිර්විදාහරණයේ" අවසාන පරිච්ඡේදයේ (XXII. 20) සඳහන් වන්නේ කාලිදාස වික්‍රමාදිත්‍ය රජුගේ රාජ සභා කවීන් නව දෙනකු අතුරින් හෙවත් නවරත්නයන්ගෙන් කෙනකු බව යි.

"ධන්වන්තරික්ෂපණකාමරසිංහශඞ්කු වේතාලභට්ටඝටඛර්පරකාලිදාසාඃ,

ඛ්‍යාතෝ වරාහමිහිරෝ නෘපතේඃ සභායාං රත්නානි වෛ වරරුචිර්නවවික්‍රමස්‍ය. (Śrīkālidāsa, 1988. 656. ජ්‍යොතිර්විදාහරණය, XXII. 10 පද්‍යය.)

වරාහමිහිර ද ඒ අතුරින් එක් රත්නයක් ලෙස සඳහන් වෙයි. ඔහු සිය කෘතිවල ආර්යභට්ට (ක්‍රි.ව. 499) උපුටමින් කරුණු සඳහන් කරන අතර, බ්‍රහ්මගුප්ත (ක්‍රි.ව. 628) වරාහමිහිර උපුටා දක්වයි. බ්‍රහ්මගුප්තගේ "ඛණ්ඩඛාද්‍යක" නම් වූ කෘතියේ ව්‍යාඛ්‍යාකාර අමරජ වරාහමිහිර ක්‍රි.ව. 587 දී මිය ගිය බව පවසයි. ඒ අනුව වරාහමිහිරගේ සමකාලීනයකු ලෙස සඳහන් වන කාලිදාස ද සවැනි සියවසට අයත් කළ හැකි ය.

මෙය ද විශ්වාස කට යුතු සාධක මත ස්ථාපිත මතයක් නො වෙයි. පළමු ව ම ජ්‍යෝතිර්විදාහරණ කෘතිය 12 වැනි ශතවර්ෂයට අයත් වූවක් වන අතර එය කාලිදාසගේ රචනයක් විය නොහැකි ය. තව ද, නවරත්න පිළිබඳ සංකල්පය විවිධ කාල වකවානුවල කවීන් සහ විද්වතුන් එක ම සභාවකට රැස් කළ කවි කල්පිතයකි. එය ඓතිහාසික වාර්තාගත නිරවද්‍ය තොරතුරක් ලෙස ගැනීම විචාරශීලී කටයුත්තක් නො වෙයි. විශ්වසනීය ලෙස පිළිගත නොහැකි මෙම එක් කිරීම නිසා කාලිදාසගේ කාලය සවැනි සියවසට අයත් කිරීම නුසුදුසු ය.

### 3.8. ක්‍රිස්තු වර්ෂ සත්වැනි සියවස

ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදී සිටිය දී ගණිකාවක අතින් කාලිදාසගේ මරණය සිදු වීම, ඔහුගේ මිතුරකු වූ කුමාරදාස විසින් එම ඝාතනය සොයාගැනීම, එම කුමාරදාස ජානකීහරණ නම් සංස්කෘත මහාකාව්‍යය සම්පාදනය කළ ලාඞ්කේය නරපතියා ලෙස හඳුනාගැනීම සහ ඔවුන් දෙදෙනාගේ මිත්‍රත්වය පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රයාගත සහ ජනප්‍රවාදාගත කරුණු සලකමින් ඇතැමෙක් ක්‍රිස්තු වර්ෂ සවැනි හෝ සත්වැනි සියවස කාලිදාසගේ ජීවන සමය වන්නට ඇතැයි පවසති.

මයූරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමි ක්‍රි.ව. 1266 දී (සන්නස්ගල, 1994. 183.) පූජාවලියේ සඳහන් කරන පරිදි ලක්දිව රජ කළ කුමාරදාස නම් රජු කාලිදාසගේ වියෝගය පිළිබඳ අසා ශෝකයෙන් දිවි නසාගෙන ඇත. "දාසෙන් කැලි රජහුගේ සමාන දරු වූ මුගලන් රජ සීගිරි රජහුගේ බියෙන් දඹදිවට ගොස් බලපිරිස් ගෙන ලක්දිව බැස පියරජහු මැරූ සීගිරි කසුබු රජු මරා අටළොස් හවුරුද්දක් රාජ්‍යය කළේ ය. ඔහු පිත් කුමරදස් රජ මහ පණ්ඩිත වැ නව හවුරුද්දක් රාජ්‍යය කොට කාලිදාස නම් යහළුවා මළ දා තෙමේ ද ගිනි වැද පරලොව ගියේ යැ"(සුරවීර, ඒ. වී. 1998. පූජාවලී 34 පරි). කුමාරදාස යනු ජානකීහරණය නම් සංස්කෘත මහාකාව්‍යය රචනා කළ ප්‍රකට ලාඞ්කේය කවියෙකි. මොහු වනාහි පළමුවැනි මුගලන් රජුගේ පුතු වන ක්‍රි.ව. 508-516 ලක්දිව රජ කළ කුමාරධාතුසේන බව දෙහිගස්පේ පඤ්ඤාසාර හිමියෝ පවසති. (පඤ්ඤාසාර හිමි, 2015.). ඇතැම් සාහිත්‍යික මූලාශ්‍රය අනුව කාලිදාස මොහුගේ මිතුරකු වූ අතර ලංකා රාජ්‍යයෙහි දී සිදු වූ කිසි යම් අවාසනාවන්ත සිදුවීමක් කාලිදාසගේ මරණයට සේ ම කුමාරදාසගේ ආත්මත්‍යාගයටත් හේතු වී ඇත.

"කමලේ කමලෝත්පත්තිඃ - ශ්‍රූයතේ න ච දෘශ්‍යතේ

බාලේ තව මුඛාම්භෝජේ - දෘෂ්ටමින්දීවරද්වයම්"

මෙය එම ජනප්‍රවාදාගත ප්‍රවෘත්තිය හා සබැඳි සමස්‍යාව යි. සනාථ කිරීමට තරම් ප්‍රමාණවත් ඓතිහාසික තොරතුරු විරල වීම නිසා ඇතැමෙක් මෙය පිළිගන්නට මැළි වෙති.

"වෙහෙර දසටක් පුරා කරවා දස අටක් මහ වැව් බැඳී
වසර එකදා බිසව් අබිසෙස් මහණුවම් තෙමඟුල් යෙදී
ඇජර කිවියර පිනෙන් ජානකිහරණ ඈ මහ කව් බැඳී
කුමරදස් රජ කාලිදස් නම් කිවිඳු හට සිය දිවි පිදී" (ද සිල්වා, 1954. පැරකුම්බා සිරිත, 23 පද්‍යය).

පසළොස්වැනි සියවසේ රචනා වූ පැරකුම්බා සිරිතෙහි පද්‍යය ද උක්ත කරුණ පුනරුච්චාරණය කරන්නේ නමුදු විචාරක අවධානය යොමු ව ඇත්තේ මඳ වශයෙනි.

ජානකීහරණං කර්තුං - රඝුවංශේ ස්ථිතේ සති
කවිඃ කුමාරදාසශ් ච - රාවණශ්ච යදි ක්ෂමඃ. (Bhattacharyya, B. (Ed.). (1938). IV, 76. 45.).

'රාජශේඛර කාව්‍යමීමාංසාවෙහි සඳහන් කොට ඇතැ' යි පවසමින් ජල්හණ (ක්‍රි.ව. තෙළෙස්වැනි ශතවර්ෂය, 1200-1250) සිය සූක්තිමුක්තාවලියේ කවිකාව්‍යප්‍රශංසා නම් සිවුවැනි පරිච්ඡේදයේ ඇතුළත් කොට ඇති ශ්ලේෂාර්ථ සහිත මෙම පද්‍යයෙන් ද කාලිදාස සහ කුමාරදාස අතර යම් සබඳකමක් ධ්වනිත වෙයි.

ජානකීහරණය ගොඩකුඹුර සමග සංස්කරණය කොට පළ කිරීමේ දී පරණවිතාන ඉතිහාසය ආශ්‍රිත සිය සුපරිචිත දැනුමෙන් යුතු ව, කාව්‍යයේ අටවැනි සහ විසිවැනි සර්ගවල අවසානයේ ඇතුළත් කුමාරදාසගේ පවුල් සබඳතා පිළිබඳ පද්‍ය කිහිපයක් විශේෂ විමසුමකට ලක් කරයි. දොළොස්වැනි සියවසේ පමණ සම්පාදිත යැයි සැලකෙන සිංහල සන්නයෙන් මෙම පද්‍ය විවරණය කර ඇත. එබැවින් ඒවා සන්නයේ කර්තෘවරයා විසින් ම වලංගු ලෙස පිළිගත් බවත් සන්නයට වඩා පැරණි බවත් සඳහන් කළ හැකි ය. මෙම පද්‍යවලින් ඔප්පු වන්නේ කුමාරදාස නම් කවියා පළමුවැනි මුගලන්ගේ පුත් කුමාරදාස රජු සමග කිසි දු සම්බන්ධයක් නොමැති බව යි. ඔහු සිංහල රාජකීය පවුලේ සාමාජිකයකු වුව ද, බොහෝ විට II වැනි කාශ්‍යප (ක්‍රි.ව. 650 - 659) රජුගේ වැඩිමහල් සහෝදරයා වන යුවරජ මානගේ (මානිත) පුත්‍රයා විය හැකි ය. දෙවැන්නා (මාන) පල්ලව රාජ සභාවේ සිටි මානවම්මගේ පියා වූ අතර II වැනි නරසිංහවර්මන්ගේ සහාය ඇති ව අනුරාධපුර සිංහාසනයට පත් විය. කුමාරදාස කවියා ශ්‍රී ලංකාවේ ඇති වූ කලබලකාරී වාතාවරණය හේතුවෙන් **සහ** සංස්කෘත ඉගෙනුම සඳහා එහි කේන්ද්‍රස්ථානයක් වූ කාංචි (කාංචීපුරම්) නගරයට ගිය ආකාරය ජානකීහරණයෙන් පැහැදිලි වේ. එම නිසා ඔහුගේ කාලය මානවම්ම (ක්‍රි.ව. 684-718) රාජ්‍ය සමයට වැටේ.

මෙම තොරතුරුවලින් එළැඹි නිගමනය වන්නේ "ජානකීහරණයේ කතුවරයා වශයෙන් සැලකෙන කුමාරදාස රජුගේ තොරතුරු සපයන මූලාශ්‍රය සහ කුමාරදාස කාලිදාස අතර මිත්‍රත්වය ගැන සාම්ප්‍රදායික මත පුළුල් ව විමර්ශනයට ලක් කළ කල්හි සමහර මූලාශ්‍රයවල සඳහන් කුමාර-ධාතුසේන රජු සහ කුමාරදාස කවියා අතර කිසි දු සබඳතාවක් නොමැති බව" යි (Paranavitana, & Godakumbura, 1967. 34.). මෙම ප්‍රකාශයත් සමග ම කාලිදාසගේ සහ කුමාරදාසගේ සමකාලීන බව පිළිබඳ අදහස ද ප්‍රතිෂ්ඨා රහිත වෙයි.

පරණවිතාන සහ ගොඩකුඹුර විසින් කුමාරදාසගේ ජානකීහරණය සංස්කරණය කොට East and West නම් ඉතාලි ජර්නලයට යොමු කළ පර්යේෂණ පත්‍රිකාව සමාලෝචනය කරන ජුසෙප් ටුච් පරණවිතානයන්ගේ අදහස් ප්‍රශංසාත්මක ව ඉදිරිපත් කරයි **(Tucci, 1972. 341-342).**
හුදු ජනප්‍රවාද සහ සන්නකරුවන්ගේ වැරදි කියවීම් ඉවත් කළ හොත් "දැනට ලබා තිබෙන සාක්ෂි කුමාරදාසගේ කාලය ක්‍රි.ව. 700-750 අවට යෙදීමට නිසැක ව ම උපකාරී වන බවත් මම යෝජනා කරමි." යනුවෙන් පවසන කීත් **(Keith, 1901)** "ශ්‍රී ලංකාවේදී ගණිකාවක අතින් සංචාරයක යෙදී සිටිය දී සිදු විණැයි කියන කාලිදාසගේ මරණය සහ ඔහුගේ මිතුරකු වූ කුමාරදාස විසින් එම ඝාතනය සොයාගැනීම පිළිබඳ පුවත ඉතා ප්‍රමාද වී පැමිණි සහ මුල් ම සාක්ෂිවලින් සහාය නොදක්වන සම්පූර්ණයෙන් ම වටිනාකමක් නැති" කරුණක් ලෙස ප්‍රතික්ෂේප කරයි **(Keith, 1959. 144.).**

**3.9. ක්‍රි.ව. එකොළොස්වැනි සියවස**

ධාරා නුවර භෝජ රාජ සභාවෙහි කාලිදාස කටයුතු කළ බව කියැවෙන භෝජප්‍රබන්ධාගත තොරතුරු මත ඇතැමෙක් කාලිදාස එකොළොස්වැනි ශතවර්ෂයට අයත් කරනු කැමැති වෙති. ක්‍රි.ව. සොළොස්වැනි සියවසේ විසූ බල්ලාල හෙවත් බල්ලාලසේන නම් කවියකු විසින් එකොළොස්වැනි සියවසේ මුල් භාගයේ ධාරාහි රජ කළ ශෘඞ්ගාරප්‍රකාශ වැනි ග්‍රන්ථ සම්පාදනය කළ භෝජදේව චරිතය විස්තර කරමින් භෝජප්‍රබන්ධය රචනා කොට ඇත. ජ්‍යෝතිර්විදාභරණයෙහි වික්‍රමාදිත්‍ය රජ සබයට නවරත්නයක් රැස් කළ සෙයින්, භල්ලාල ද කාලතරණය කරමින් පූර්ව ගුප්ත යුගයේ සිට මධ්‍යතන යුගය දක්වා වූ සියවස් ගණනාවක ඉතිහාසයේ විවිධ යුගවල සිටි කවීන් එක ම සභාවකට රැස් කරයි. එම කවීන් එකිනෙකා අතර සහ රජු සමඟ සිදු වන අභියෝග, වාද, විවාද සහ සංවාද ගද්‍ය-පද්‍ය ලෙස මෙහි ඉදිරිපත් වෙයි. එහි වූ කවීන් අතුරින් වඩාත් ප්‍රභාවත් කවියා සහ රජුගේ හිතෛෂී මිත්‍රයා වූයේ කාලිදාස වෙයි. ජනශ්‍රැති සහ මිථ්‍යාකථා සංග්‍රහ කරමින් සම්පාදනය වූ බව පැහැදිලි ව පෙනෙන භෝජප්‍රබන්ධයෙහි වරරුචි, භාරවී, දණ්ඩීන්, බාණ, මාඝ, ශ්‍රී හර්ෂ, භවභූති, මයූර, කවිශේඛර, මල්ලිනාථ වැනි කවීන් පිළිබඳ සඳහන් වෙයි.
භෝජප්‍රබන්ධයේ ඓතිහාසික වටිනාකම පවතින්නේ එහි භෝජ රජුගේ චරිතය යම් තරමකින් ප්‍රතිනිර්මාණය වූයේ ය යන පදනමෙහි පමණකි. ඒ හැරුණු විට මධ්‍යතන ඉන්දියානු සාහිත්‍යමය සංස්කෘතියේ "මහාකවීන්" පිළිබඳ චින්තනයේ, සංකල්පයේ ස්වරූපය මෙහි රූපණය වෙයි. එය ඓතිහාසික වාර්තාවක් ලෙස නොසැලකිය යුතු ය. ඒ පිළිබඳ කීත් පවසන්නේ "වටිනාකමක් නැති ප්‍රබන්ධයක්" **(Keith, 1959. 143.)** ලෙස ය. එනිසා භෝජප්‍රබන්ධය පදනම් කොට කාලිදාසගේ කාලය ක්‍රි.ව. එකොළොස්වැනි සියවසට අයත් කිරීම නිරර්ථක ය.

**3.10. ගුප්ත යුගය (320 සිට 455) පිළිබඳ කල්පිතය**

මහාකවි කාලිදාසගේ ජීවන සමය පිළිබඳ විද්වතුන් වඩාත් පිළිගත් මතය වන්නේ ක්‍රිස්තු වර්ෂ 375 සිට 415 දක්වා ගුප්ත අධිරාජ්‍යය පාලනය කළ දෙවැනි චන්ද්‍රගුප්ත රජුගේ පාලන සමය හෝ ඔහු පුත් කුමාරගුප්ත (415-455) සමය වූ බව යි (ථාපර්, 1994. 135.). "ඉන්දීය හා යුරෝපීය විචාරක දෙපිරිස ම උසස් ම සංස්කෘත කවියා ලෙස පිළිගන්නා කාලිදාස වැජඹුණේ දෙවැනි චන්ද්‍රගුප්ත සහ පළමුවැනි කුමාරගුප්ත (375 - 455) යන රජුන්ගේ කාලයෙහි ය" (බෂාම්, 1995. 523.). මෙම මතයට

පදනම් වී ඇත්තේ කාලිදාසගේ කෘතිවල ගුප්ත රජුන් සහ ඔවුන්ගේ රාජ සභාව ගැන සඳහන් කිරීම්, එම යුගයේ සෙල්ලිපි සහ වෙනත් ඓතිහාසික සාධක ය.

කාලිදාසගේ කාලය ගුප්ත යුගයට ඇතුළත් කිරීමට හේතු වන ඔහුගේ ජීවන සමයේ පූර්ව සහ අපර සීමාවන් පිළිබඳ ග්‍රන්ථාන්තරයෙන් ලැබෙන නිශ්චිත සාක්ෂ්‍ය කිහිපයක් මෙසේ ය.

"ප්‍රථිතයශසාං භාසසෞමිල්ල කවිපුත්‍රාදීනාං ප්‍රබන්ධානතික්‍රම්‍ය කථං වර්තමානස්‍ය කවේඃ කාලිදාසස්‍ය කෘතෞ බහුමානඃ" (Tawney, 1964. 03.). මේ කාලිදාසගේ මාලවිකාග්නිමිත්‍රයේ එන භාස නම් පූර්වකාලීනයා පිළිබඳ සඳහන යි. ඒ හැර ඔහුගේ අනෙක් කෘතිවලින් සමකාලීනයන් පිළිබඳ සඳහන් නො වේ. භාසගේ කාලය ක්‍රි.ව. දෙවැනි සියවස පමණ වේ යනු විචාරක මතය යි. භාස ප්‍රකට කීර්තියක් ඇති කවියකු වීමට සියවසක් වත් ගත වූ බව සිතතොත් කාලිදාසගේ කාලය තෙවැනි හෝ සිවුවැනි සියවසෙන් මෑතක විය යුතු ය.

කාලිදාසගේ නිර්මාණ අධ්‍යයනය කරන විට වාත්ස්‍යායනගේ කාමසූත්‍ර පිළිබඳ ඔහුගේ පුළුල් වූ ශාස්ත්‍රීය අවබෝධය ප්‍රකට වෙයි. වාත්ස්‍යායන විවාහක කාන්තාවකගේ යුතුකම් ගෙනහැර දක්වමින් කාමසූත්‍රයෙහි පහත සූත්‍ර රචනා කොට ඇත.

"ගුරුෂු භෘත්‍යවර්ගේෂු නායකභගිනීෂු තත්පතිෂු යථාර්හ ප්‍රතිපත්තිඃ" **(**Sharma**,** 2001**.** කාමසූත්‍ර, භාර්යාධිකාරික, සිවුවැනි අධිකරණය, ප්‍රථම අධ්‍යාය, ඒකචාරිණී වෘත්ත ප්‍රකරණ. 4ඃ1ඃ 05. 106.)

"ශ්වශ්‍රූශ්වශුරපරිචර්යා තත්පාරතන්ත්‍ර්යමනුත්තරවාදිතා පරිමිතා ප්‍රචණ්ඩාලාපකරණමනුච්චෛර්හාසඃ තත්ප්‍රියාප්‍රියේෂු ස්වප්‍රියාප්‍රියේෂ්විව වෘත්තිඃ."**(**Sharma, 2001). 4:1: 37. 110**.)**

භෝගේෂ්වනුත්සේකඃ. 4:1: 3**8**. පරිජනේ දාක්ෂිණ්‍යම්. ... **4**.**1**. **39**." (Sharma, Ed. & Trans. (2001).

ඉහත සූත්‍රවල විසිරී ඇති අදහස් කාලිදාස සිය අලංකාරවත් රචනා ශෛලිය භාවිතයෙන් රසවත් පද්‍යයක් බවට පරිවර්තනය කොට කුලගුරු කණ්ව හෙවත් කාශ්‍යප මුනිගේ මුවින් පති කුලයට යන ශකුන්තලාට ලැබෙන ඉතා විශිෂ්ට හා හෘදයාංගම උපදේශයක් ලෙස ඉදිරිපත් කොට ඇත.

> "ශුශ්‍රූස්ව ගුරූන්කුරු ප්‍රියසඛීවෘත්තිං සපත්නීජනේ
> භර්තෘර්විප්‍රකෘතාපි රෝෂණතයා මා ස්ම ප්‍රතීපං ගමඃ
> භූයිෂ්ඨං භව දක්ෂිණා පරිජනේ භාග්‍යෙෂ්වනුත්සේකිනී
> යාන්ත්‍යෙවං ගෘහිණීපදං යුවතයෝ වාමාඃ කුලස්‍යාධයඃ" (මාරසිංහ, **2021**. **114**.
> අභිඥානශාකුන්තල iv, **18**.)

මෙම පද්‍යය වාත්ස්‍යායන සූත්‍ර හා සසඳන විට මුල් අදහස වාත්ස්‍යායනගේ බව පැහැදිලි වෙයි. ඒ අනුව කාලිදාස වාත්ස්‍යායනට වඩා නවීන ය. කාමසූත්‍රයේ දක්නට ලැබෙන සමාජ, දේශපාලන තොරතුරු අනුව වින්ටර්නිට්ස් **(**Winternitz, M**.** 1922**.** *History of Indian Literature*, Vol. 3, Part 1**,** 620-621**),** බෂාම් **(**Basham, A. L. 1954.**)** සහ ෂර්මා **(**Sharma, R. S. **2001.** *Early Medieval Indian Society: A Study in Feudalisation*, 10.**)** වැනි විද්වත්හු වාත්ස්‍යායනගේ කාලය ක්‍රි.ව. තුන්වන සියවසේ මැද භාගයට හෝ එයට පූර්ව කාලයකට අයත් කරති. මෙහි සඳහන් පරිදි කාලිදාස ඔහු අනුගමනය කළේ නම් කාලිදාස ක්‍රි.ව. **250**න් පසු ජීවත් වූ බව වඩාත් නිශ්චිත ව පැවසිය හැකි වෙයි. බාණයන්ගේ හර්ෂචරිතයෙහි ඇතුළත් පහත සඳහන කාලිදාසගේ ජීවන සමය පිළිබඳ මෑත සීමාව නිසැක ව පැවසිය හැකි විශේෂ ප්‍රකාශයකි.

"නිර්ගතාසු නවාකස්‍ය - කාලිදාසස්‍ය සූක්තිෂු

ප්‍රීතිර්මධුරසාන්ද්‍රාසු - මඤ්ජරීෂ්විව ජායතේ" (Cowell, 1897. **16**th Verse)

බාණගේ කාලය **07** සියවසේ පූර්ව අර්ධය එනම් **606 - 647** ශ්‍රී හර්ෂගේ සමය බව නිසැක ව හඳුනාගෙන ඇති හෙයින් කාලිදාස එයට පූර්වකාලීන විය යුතු ය.

මෙම කාර්යයේ දී සහායට පැමිණෙන තවත් ඓතිහාසික වටිනාකමකින් යුතු සාක්ෂ්‍යයකි, දෙවැනි පුලකේශී රජු (ක්‍රි.ව. **610-642**) වර්ණනා කරමින් රවිකීර්ති නම් තැනැත්තා විසින් රචනා කළ " ඓහෝල් ප්‍රශස්ති" නමින් හැඳින්වෙන ශිලාලේඛනය. ඉන්දියාවේ, කර්ණාටකයේ, බගල්කෝට් දිස්ත්‍රික්කයේ පිහිටි ඓහෝල් නම් ස්ථානයේ දී හමු වී ඇති මෙය සංස්කෘත භාෂාවෙන් සහ පැරණි චාලුක්‍ය අක්ෂරවලින් (Sanskrit in old Chālukyan script) ලියැවී ඇති මෙය උසස් කවියකු හා රාජ ද්වාර කර්මාන්ත ශිල්පියකු වූ රවිකීර්ති විසින් සම්පාදනය කොට ඇත. චාලුක්‍ය වංශික දෙවැනි පුලකේශී සහ ඔහුගේ පරම්පරාව පිළිබඳ විස්තරවන මෙහි හර්ෂවර්ධනට එරෙහි ව නර්මදා නදිය අසබඩ සටනින් (ක්‍රි.ව. **618-619** පමණ) ලැබූ ජයග්‍රහණය විස්තරාත්මක ව දැක්වෙයි. ඓහෝල්හි අලංකාර මන්දිර හා වාසස්ථාන ඉදි කිරීම පිළිබඳ වර්ණනාත්මත විස්තර ද ඇතුළත් කරන රවිකීර්ති කාලිදාස සහ භාරවී දෙදෙනා කීර්තිමත් කවීන් ලෙස හඳුනාගෙන සිටි බැව් ධ්වනිත කරයි. **"**yenāyōji naveśmasthiramarthavidhau vivekinā jinaveśma sa vijayatāṃ ravikīrtiḥ kavitāśritakālidāsabhāravikīrtiḥ**"** (යේනායෝජි නවේශ්මස්ථිරමර්ථවිධෞ විවේකිනා ජිනවේශ්ම ස විජයතාං රවිකීර්තිඃ කවිතාශ්‍රිත කාලිදාසභාරවිකීර්තිඃ) **(**Epigraphia Indica, Vol. VI, Reprinted **1996**. P 07.**)** මෙයින් සිය කවිත්වය කාලිදාසගේ සහ භාරවිගේ සමකක්ෂීයත්වයෙන් පිළිගන්නා ලෙස කරන ඉල්ලීමක් හෝ එයට අභියෝග කිරීමට සූදානම් බවක් පැවසෙයි. කාලිදාසගේ සහ භාරවිගේ කාලය ස්ථාපිත කිරීමට උපකාරී වන මෙම ලිපිය රචනා වූ කාලය "pañcāśatsu kalau kālē ṣaṭsu pañcaśatāsu ca samāsu samatitāsu śakānāmapi bhūbhujām." (පඤ්චාශත්සු කලෞ කාලේ ෂට්සු පඤ්චශතාසු ච සමාසු සමතිතාසු ශකානාමපි භූභුජාම්) **(**Epigraphia Indica, Vol. VI, Reprinted **1996**. P 07.**)** යනුවෙන් කලියුගයේ ශක රාජ වර්ෂ ක්‍රමයෙන් පන්සිය පණස් හය වසක් ගෙවී ගිය තැන එනම් ක්‍රි.ව. **634** දී බව එයින් පැවසෙයි.

බාණ කවියාගේ හර්ෂචරිතයට ද වැඩි නිරවද්‍යතාවකින් මෙහි කාලය ගණනය කළ හැකි අතර ඒ අනුව ක්‍රි.ව. **634** වන විට කාලිදාස සෙසු කවීන්ගේ පරමාදර්ශයක් වන ආකාරයේ කීර්තියක් හිමි කවියකු ලෙස ප්‍රකට ව සිටි බව පැහැදිලි වෙයි.

දශපුරයේ දෙවොලක නවකම් කිරීමෙන් අනතුරු වත්සභට්ටි විසින් රචනාකොට ස්ථාපිත " මන්දසෝර්" ශිලාලේඛනය කාලිදාසගේ කාලය සෙවීමට පිටිවහලක් වෙතැයි කීත් පවසයි (සේනානායක, **1965**. **116**.). ඔහුට අනුව එය පිහිටුවා ඇත්තේ **472** දී ය. කාලිදාසගේ මේඝදූතයේ සහ ඍතුසංහාරයේ ආභාසය ප්‍රකට කරන්නේ යැයි හැඟෙන පද්‍ය දෙකක් එහි වෙයි. කීත් නිසැක ව පවසන්නේ ග්‍රාමීය කවියකුගේ අප්‍රකට නිමැවුමක් දෙස බලා කාලිදාස සිය රචනා විලාසය සකසාගත්තේ යැයි සිතනවාට වඩා ශ්‍රේෂ්ඨ කවියකුගේ නිමැවුමක් ඇසුරෙන් වත්සභට්ටි සිය නිමැවුම හැඩගසාගත්තේ යැයි සිතීම උචිත බව යි.

"චලත් පතාකාන්‍යබලාසනාථාන්‍යත්‍යර්ථශුක්ලාන්‍යධිකෝන්නතානි

තඩිල්ලතාචිත්‍රසිතාභ්‍රකූට - තුල්‍යෝපමානානි ගෘහාණි යත්‍ර" (වත්සභට්ටි, මන්දසෝර් **10**)

"විද්‍යුත්වන්තං ලලිතවනිතං සේන්ද්‍රචාපං සචිත්‍රාං

සංගීතාය ප්‍රහතමුරජාඃ ස්නිග්ධගම්භීරඝෝෂම්

අන්තස්තෝයං මණිමයභුවඃ තුංගමභ්‍රංලිහාග්‍රාඃ

ප්‍රාසාදාස්ත්වාං තුලයිතුමලං යත්‍ර තෛස්තෛර් විශේෂෛඃ" (කාලිදාස, මේඝදූතය **66**)

"ස්මරවශගතතරුණජනවල්ලභාංගනා විපුලකාන්තපීනෝරු

ස්තනජඝනඝනාලිංගනනිර්භර්ත්සිතතුහිනහිමපාතේ" (වත්සභට්ටි, මන්දසෝර් **33**)

"පයෝධරෛඃ කුංකුමරාගපිඤ්ජරෛඃ - සුඛෝපසෙව්‍යෛර්නවයෞවනෝෂ්මභිඃ

විලාසිනීභිඃ පරිපීඩිතෝරසඃ - ස්වපන්ති ශීතං පරිහෘය කාමිනඃ" (කාලිදාස, ඍතුසංහාර v, **9**)

මේ වත්සභට්ටටිගේ සහ කාලිදාසගේ සාම්‍යය ප්‍රකට වන පද්‍ය ද්වය යි.

මේ ආකාරයට භාස සහ වාත්ස්‍යායන ඇසුරෙන් පනවාගත් ක්‍රි.ව. **250** පමණ වූ පූර්ව සීමාව සහ රවිකීර්ති, බාණ සහ වත්සභට්ටි ඇසුරෙන් පනවාගත් ක්‍රි.ව. **450** යන අපර සීමාව අතර කාලයේ කවර ස්ථානයක කාලිදාගේ ජීවන සමය වී දැයි විමසිය යුතු වෙයි.

එහි ලා විශේෂයෙන් උපකාරී වන කවි, විචාරක සහ ඉතිහාසඥ යන පාර්ශ්ව තුනෙහි ම අවධානය යොමු වූ පුරාවෘත්තයක් වෙයි. එය සංක්ෂිප්ත ව මෙලෙස ය. රාජශේඛර (ක්‍රි.ව. **850-925**) කාව්‍යමීමාංසාවෙහි ශබ්දහරණ නම් ix වැනි අධ්‍යායෙහි පදෛකදේශග්‍රහණ නම් කාව්‍ය ප්‍රයෝගයට නිදසුන් දක්වමින් මෙබඳු පද්‍ය සහිත කොටසක් උපුටා දක්වයි.

"පාදෛකදේශාග්‍රහණමපි පදෛකදේශෝපලක්ෂණපරම් යථා -

අසකලහසිතත්වාත්ක්ෂාලිතානීව කාන්ත්‍යා

මුකුලිතනයනත්වාද්ව්‍යක්තකර්ණෝත්පලානි

පිබති මධුසුගන්ධීන්‍යානනානි ප්‍රියාණාං

ත්වයි විනිහිතභාරඃ කුන්තලානාමධීශඃ

යථා චෝත්තරාර්ධේ - පිබතු මධුසුගන්ධීන්‍යානනානි ප්‍රියාණාං - මයි විනිහිතභාරඃ කුන්තලානාමධීශඃ" **(**Rājaśekhara**,** 1934. **60.** *Kāvyamīmāṃsā***,** xi.**)**

රාජශේඛර මෙම නිදසුන ලබාගැනුනේ කවර මූලාශ්‍රයකින් දැයි නො දක්වයි. එහෙත් ඔහු කාලිදාස දැන සිටි බව කියැවෙන ඉහතින් උපුටා දැක්වුණු "ජානකීහරණං කර්තුං .." ආදි ශ්ලෝකය අතිශයින් ප්‍රකට ය. (Bhattacharyya, 1938. 45. IV, 76.).

භෝජරාජගේ ශෘඞ්ගාරප්‍රකාශයේ (ක්‍රි.ව. **11** වැනි ශතවර්ෂය) කාලිදාස සහ වික්‍රමාදිත්‍ය අතර සිදු වුණු සංවාදයකින් උපුටාගත් බව දක්වමින් මෙම පද්‍යය ඉදිරිපත් වෙයි. නෛයායිකී නම් කාව්‍ය ප්‍රයෝගයට නිදසුන් දෙමින් සාපේක්ෂශබ්දශබ්දශක්තිප්‍රකාශ නම් අෂ්ටම ප්‍රකාශයේ දී "කුන්තල දේශයේ රජ කුමක් කරන්නේ දැ"යි වික්‍රමාදිත්‍ය රජු විමසූ විට කාලිදාසගේ පිළිතුර මෙසේ විය.

"කාලිදාසඃ කිං කුන්තලේශ්වරඃ කරෝතීති වික්‍රමාධිත්‍යෙන පෘෂ්ට උක්තවාන්.

අසකලහසිතත්වාත්ක්ෂාලිතානීව කාන්ත්‍යා

මුකුලිතනයනත්වාද්ව්‍යක්තකර්ණත්පලානි

පිබති මධුසුගන්ධීන්‍යානනානි ප්‍රියාණාං

ත්වයි විනිහිතභාරඃ කුන්තලානාමධීශඃ

ඉදමේවෝහයිත්වා වික්‍රමාදිත්‍යඃ ප්‍රත්‍යුවාච -

පිබතු මධුසුගන්ධීන්‍යාননානි ප්‍රියාණාං - මයි විනිහිතභාරඃ කුන්තලානාමධීශඃ" (ශෘඞ්ගාරප්‍රකාශ, viii වැනි ප්‍රකාශය, නෛයායිකී විස්තරය **270**පිට.)

ක්ෂේමේන්ද්‍ර (ක්‍රි.ව. **11** වැනි ශතවර්ෂය) ඖචිත්‍යවිචාරචර්චාහි අධිකරණෞචිත්‍යය සඳහා නිදර්ශන පද්‍යයක් උපුටා දක්වමින් එය කාලිදාසගේ කුන්තලේශ්වරදෞත්‍ය නම් කෘතියෙන් ලබාගෙන ඇති බව සඳහන් කරයි.

"අධිකරණෞචිත්‍යං යථා - කුන්තලේශ්වරදෞත්‍යෙ කාලිදාසඃ -

ඉහ නිවසති මේරුඃ ශේඛරඃ ක්ෂමාධරාණාං

ඉහ විනිහිතභාරාඃ සාගරාඃ සප්තචාන්‍යෙ

ඉදමහිපතිභෝගස්තංභවිභ්‍රාජ්‍යමානං

ධරණිකලමිහෛව ස්ථානමස්මද්විධානාම්

අත්‍ර මහාරාජදූතෝ'පි සාමන්තාස්ථානේ ස්වප්‍රභුසමුචිතගෞරවපූජාර්හමාසනමාසාද්‍ය කාර්යවශේන භූමාවේවෝපවිෂ්ටඃ ප්‍රාගල්භ්‍යගාම්බීර්යේණෛවං භූතේ" (Jha, 1982. Kṣemendra's *Aucityavicāracarcā*.)

මෙම පද්‍යයේ පසුබිම විස්තර කරමින් "කුන්තලේශ්වරදෞත්‍ය" කාව්‍යයෙහි කාලිදාස තමන් රාජ දූතයකු වශයෙන් කටයුතු කරන විට කුන්තලේශ්වර රාජ සභාවෙහි උචිත අසුනක් නොලැබුණු කල්හි බිම හිඳගත් ආකාරය" පැවසෙන බව ක්ෂේමේන්ද්‍ර කියයි (ක්ෂේමේන්ද්‍ර, ඖචිත්‍යවිචාරචර්චා, අධිකරණෞචිත්‍යය, **108-109** පිටු).

රාජශේඛර, භෝජරාජ සහ ක්ෂේමේන්ද්‍ර ස්වකීය කෘතීන්හි උපුටා දක්වා ඇති අවස්ථා සහ එහි ඇතුළත් පද්‍ය තුන ම එකිනෙක හා සම්බන්ධ වන අතර ඒ හා බැඳුණු සිත්ගන්නාසුලු ඓතිහාසික ප්‍රවාදයක් වෙයි. රාජශේඛර සහ භෝජරාජ උපුටා දක්වන පද්‍ය දෙකෙන් පෙනී යන්නේ මහාකවි කාලිදාස තම අනුග්‍රාහක වික්‍රමාදිත්‍ය රජුගේ තානාපතිවරයකු ලෙස කුන්තලේශ්වර රජුගේ මාළිගාවේ කටයුතු කළ බවත් එහි තොරතුරු ස්වාමියා වෙත යොමු කළ ආකාරයත් ය. 'රාජ්‍ය භාරය තමා වෙත තබා කුන්තලෙශ්වර වරාඞ්ගනාවන්ගේ මධු සුවඳැති මුව පානය කරාවා' යි වික්‍රමාදිත්‍ය පවසන පිළිතුරු කවියෙන් කාලිදාසගේ දූත මෙහෙවර සාර්ථක වූ බව පෙනෙයි. කුන්තලේශ්වරට තම අධිරාජයා වන වික්‍රමාදිත්‍ය සමඟ රහසිගත සතුරුකමක් පැවති බවත් වික්‍රමාදිත්‍ය තානාපතියකු ලෙස කාලිදාස කුන්තලේශ්වර වෙත යවා නව මිත්‍රත්ව බැඳීම් ඇති කරගැනීමෙන් එම සතුරුකම ඉවත් කළ බවත් ක්ෂේමේන්ද්‍රගේ උද්ධෘතයෙන් අනුමාන කළ හැකි ය. කටයුතු නිමවා සිය දෙසට පෙරළා පැමිණි කාලිදාස සිය මෙහෙවර හා සබැඳි සියලු සිදුවීම් වාර්තා කරමින් කාව්‍යයක් රචනා කළ බවත් එම කෘතිය "කුන්තලේශ්වරදෞත්‍යම්" ලෙස පැරණි කවීන් සහ විචාරකයන් හඳුනාගෙන සිටි බවත් ප්‍රකට වෙයි. ඔවුන් උපුටා දක්වන පද්‍ය තුන ම ඇතුළත් වන්නේ උක්ත කෘතියෙහි ය. මෙහි සඳහන් කුන්තලේශ්වර කවරෙක් දැයි හඳුනා ගැනීම කාලිදාසගේ කාල නිර්ණයට මහත් උකාරයක් වනු ඇත.

ක්‍රි.ව. **284-550** අවධියේ කුන්තල දේශයේ (වත්මන් කර්ණාටකයේ බටහිර, මධ්‍යම කොටස්, අසල්වැසි ආන්ධ්‍රා ප්‍රදේශ්හි හා මහාරාෂ්ට්‍රයේ යම් ප්‍රදේශවලින් සමන්විත) පැවති වාකාටක රාජ්‍යයේ ඉතිහාසය පිළිබඳ ජයස්වාල් මහතා ඉදිරිපත් කළ වාර්තාව අනුව පහත සඳහන් කරුණු අනුමාන කළ හැකි ය ( Jayaswal, K. P. 1933**.** 19 (I-II), 1–XX.). පළමුවැනි පෘථිවිසේන රජ (ක්‍රි.ව. **348-375**) කුන්තල දේශය

සහ කදම්බ රාජධානිය පාලනය කළ හෙයින් 'කුන්තලේශ' යන විරුද නාමය ලැබුවේ ය. ඔහු ගුප්ත රජවරුනට විරුද්ධව සිටි බව පෙනේ. එයට හේතුව, සමුද්‍රගුප්ත රජු පෘථිවිසේනගේ පියා වූ පළමුවැනි වාකාටක රුද්‍රසේන (හෝ රුද්‍රදේව ක්‍රි.ව. **344-348**) පරාජය කර වධහිංසාවට ලක් කිරීම යි. පසු ව සමුද්‍රගුප්ත පෘථිවිසේන ඔහුගේ පියාගේ රාජ්‍ය සිහසුනට නැවත පත් කළේ ගුප්ත අධිරාජ්‍යය යටතේ රාජ්‍ය කරන 'සාමන්ත රජකු' ලෙස ය. දෙවැනි චන්ද්‍රගුප්ත රජුගේ රාජ්‍ය සමයේ දී යටත් කරගත් රජවරුන්ගේ පවුල් සමග දේශපාලනික විවාහ සම්බන්ධතා ඇරඹි අතර, එම කාලයේ දී වාකාටක රාජ කුමාරයා වූ පෘථිවිසේන සමග වූ විරුද්ධවාදී හැඟීම් ඉවත් කර මිත්‍රත්වයක් ඇති කිරීමට අරමුණු කෙරිණි. මෙම අදහස මඟින් පෙලැඹුණු චන්ද්‍රගුප්ත කාලිදාස වාකාටක පෘථිවිසේනගේ රාජ සභාවට දූතයකු ලෙස යැවී ය. පසු ව චන්ද්‍රගුප්ත විසින් තම දියණිය වූ ප්‍රභාවතී කුමරිය පළමුවැනි පෘථිවිසේනගේ පුත් දෙවැනි රුද්‍රසේනට (ක්‍රි.ව. **375-395**) විවාහ කරදෙන ලදි. ප්‍රභාවතී-රුද්‍රසේන දෙදෙනගේ පුත් වූයේ ප්‍රවරසේන ය (ක්‍රි.ව. **405-435**). 'සේතුබන්ධ මහාකාව්‍යය' පවරා ඇත්තේ මෙම ප්‍රවරසේනට ය. සාමාන්‍යයෙන් මෙය ප්‍රවරසේනගේ නමින් ඔහුගේ සීයා වන වික්‍රමාදිත්‍ය චන්ද්‍රගුප්තගේ ඉල්ලීමක් මත කාලිදාස විසින් රචනා කරන ලද්දක් යැයි විශ්වාස කෙරේ.
කාලිදාස සහ සේතුබන්ධය සම්බන්ධ කැරෙන වෙනත් ප්‍රකාශන කිහිපයක් ද වෙයි. සේතුබන්ධ පිළිබඳ අටුවාව වන රාමසේතුප්‍රදීපය මේ සම්බන්ධයෙන් සිත්ගන්නා කරුණක් වාර්තා කරයි.

"ධීරාණං කාව්‍යචර්චාචතුරිමවිධයේ වික්‍රමාදිත්‍යවාචා
යං චක්‍රේ කාලිදාසඃ කවිකුමුදවිධුඃ සේතුනාමප්‍රබන්ධම්"

ඉහ තාවන්මහාරාජප්‍රවරසේනනිමිත්තං මහාරාජාධිරාජවික්‍රමාදිත්‍යෙනාඥප්තඃ නිඛිලකවිචක්‍රචූඩාමණිඃ කාලිදාසමහාශයඃ සේතුබන්ධප්‍රබන්ධං චිකීර්ෂුඃ" (රාමසේතුප්‍රදීප, කාව්‍යමීමාංසා විස්තර **217** පිට). උක්ත අටුවාවේ අදාළ කොටසින් ප්‍රකට වන්නේ ද වික්‍රමාදිත්‍යගේ ඉල්ලීම මත කාලිදාස සේතුබන්ධය රචනා කළ බව යි.
සේතුබන්ධයේ කර්තෘත්වය පිළිබඳ මෙම අදහසට තවත් සහායක් ලැබෙන්නේ කෘෂ්ණකවිගේ 'භාරතචරිත' කාව්‍යයෙනි. එහි ද සේතුබන්ධය කුන්තල රජුට ආරෝපණය කර ඇත.
"ජාලාශයස්‍යාන්තරගාඪමාර්ගමලබ්ධබන්ධං ගිරිචෞර්යවෘත්‍යා
ලෝකේෂ්වලකාන්තමපූර්වසේතුං බබන්ධ කීර්ත්‍යා සහ කුන්තලේශඃ" (භාරතචරිත - කෘෂ්ණ කවි ත්‍රිවේන්ද්‍රම් ග්‍රන්ථ මාලාව අංක **86**, i. **4**.)

"කීරතිඃ ප්‍රවරසේනස්‍ය - ප්‍රයාතා කුමුදෝජ්වලා
සාගරස්‍ය පරං පාරං - කපිසේනේව සේතුනා" (Cowell, 1897. *The Harṣa-carita of Bāṇa*, 14 Verse.**)**

බාණ කෘත ශ්‍රීහර්ෂචරිතාගත උක්ත පද්‍යය ද ප්‍රවරසේනගේ සහ කාලිදාසගේ සේතුබන්ධය අතර සබැඳියාව ප්‍රකට කරන්නකැයි සැලකෙයි.
"මේ වික්‍රම රජු නම් කාශ්මීරයේ රජ කළ වික්‍රමාදිත්‍ය බවත් වික්‍රම සංවත්සර ක්‍රමය ඇරඹුයේ මෙම වික්‍රමාදිත්‍ය නිරිඳුන් බවත් ඔහුගේ කාලය සවැනි සියවස බවත්" කාලිදාසගේ ජීවන සමය නම් සිය කෘතියේ දී ආප්ටේ සඳහන් කරයි (සේනානායක, **1960**. **275**.). කාලිදාස සහ වික්‍රමාදිත්‍ය අතර සබැඳියාව පිළිබඳ වැඩිදුරටත් සඳහන් කරන ආප්ටේ "වික්‍රමාදිත්‍යගෙන් පසු ව කාශ්මීරයේ රාජ්‍ය භාරය ප්‍රවරසේන හට උරුම වූ බවත් ප්‍රවරසේන විතස්ථා නදිය හරහා පාලමක් බැඳීම නිමිති කොට කාලිදාස විසින් සේතුබන්ධ නම් ප්‍රාකෘත මහාකාව්‍යය සම්පාදිත බවත්" පවසයි.

ආප්ටේගේ පිළිගැනීම කාශ්මීරය පාලනය කළ ප්‍රවරසේන මෙම සේතුබන්ධයේ කතුවරයා වන බව යි. එය එසේ විය නොහැකි බවට සාධකයක් දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශයෙන් හමු වෙයි. කාශ්මීර වැසියන් මහාරාෂ්ට්‍රීය ප්‍රාකෘතය භාවිත කිරීමේ අවකාශය අවම ය. සේතුබන්ධය රචනා වූයේ මහාරාෂ්ට්‍රීය ප්‍රාකෘතයෙන් බව දණ්ඩී පවසයි.

"මහාරාෂ්ට්‍රාශ්‍රයාං භාෂා - ප්‍රකෘෂ්ටං ප්‍රාකෘතං විදුඃ

සාගරඃ සූක්ති රත්නානාං - සේතුබන්ධාදි යන්මයම්" (කාව්‍යදර්ශ, i, **34**.).

රාජතරංගිණියට සහ වර්තමානයේ පිළිගන්නා භාරතීය ඓතිහාසික වාර්තාවනට අනුව කාශ්මීරය පාලනය කළ ප්‍රවරසේන රජු ක්‍රි.ව. පළමුවැනි සහ දෙවැනි සියවස්වලට අයත් බැවින් වික්‍රමාදිත්‍යගේ හෝ කාලිදාසගේ සමකාලීනයන් නො වේ. කුන්තල රට මහාරාෂ්ට්‍රයේ කොටසක් වූ බැවින් සේතුබන්ධයේ කර්තෘත්වය ක්‍රි.ව. පස්වැනි සියවස ආරම්භයේ දී මහාරාෂ්ට්‍ර රටේ මෙම කොටස පාලනය කළ දෙවැනි වාකටක ප්‍රවරසේනට ආරෝපණය කිරීම වඩාත් සුදුසු වෙයි. ජෙනරාල් කනිංහැම් **(**General Sir Alexander Cunningham), කේ.පී. ජයස්වාල් (පුරාවිද්‍යා වාර්තා වෙළුම XI. පිටුව **123**), සහ ආචාර්ය ජී. බුහ්ලර් විසින් ද ප්‍රකාශ කොට ඇති කරුණු අනුව 'කුන්තලේශ්වරදෞත්‍ය' හි සඳහන් කුන්තලේශ්වරයා දෙවැනි ප්‍රවරසේන බව මහාචාර්ය අයියන්ගර් විසින් ද තහවුරු කොට ඇත (Aiyangar, 1941, 273.).

මෙම කවි, විචාරක සහ ඉතිහාසඥ උද්ධෘතවලින් පැහැදිලි වන්නේ වික්‍රමාදිත්‍ය සහ කාලිදාස සමීප ව සම්බන්ධ වූ බව යි. සේතුබන්ධ නිර්මාණයට එය යම් දායකත්වයක් ලබාදුන් අතර 'සේතුබන්ධ' මහාකාව්‍යයේ කර්තෘත්වය දෙවැනි ප්‍රවරසේනට හෝ කාලිදාසට හෝ පැවරීම අතීත කවීන් සහ විචාරකයන් අනුගමනය කළ සම්ප්‍රදායක් වූ බවත් පෙනී යයි. ඉතිහාසඥයන් විසින් ද කුන්තලේශ්වර, කාලිදාස සහ වික්‍රමාදිත්‍ය යන ත්‍රිපුද්ගල සම්බන්ධය තහවුරු කරන බව වැඩිදුරටත් ප්‍රකට වෙයි.

මෙලෙස ගුප්ත වංශික වික්‍රමාදිත්‍ය සහ කාලිදාස අතර සම්බන්ධතාව තහවුරු කොටගත් පසු ගුප්ත රජුන් අතුරින් කවරෙක් වික්‍රමාදිත්‍ය නාමය ලැබ කාලිදාසගේ අනුග්‍රාහකයා වී ද යන්න විමසිය යුතු වෙයි. මෙහි දී ශ්‍රීමද් අභිනන්දගේ රාමචරිතයෙන් විශාල පිටිවහලක් ලැබෙයි. අභිනන්ද යනු මධ්‍යතන යුගයේ (**11** සියවස පමණ) විසූ බෙංගාල ජාතික කවියෙකි. ඔහුගේ සර්ග සතළිහකින් සමන්විත රාමචරිත මහාකාව්‍යයේ "දශමුඛයුද්ධලක්ෂ්මණශක්තිභේදවර්ණන" නම් තිස්තුන්වැනි සර්ගය පිළිබඳ ආමුඛයෙහි 'ශකාරාති' යන විරුද නාමය ලැබූ හෙවත් ශකයනට සතුරු වූ නරපතියකු විසින් කාලිදාසගේ කෘති කීර්තිය කරා රැගෙන ගිය බව පැවසෙයි.

"හාලේනෝත්තමපූජයා කවිවෘෂඃ ශ්‍රීපාලිතෝ ලාලිතඃ

ඛ්‍යාතිං කාමපි කාලිදාසකෘතයෝ නීතාඃ ශකාරාතිනා,

ශ්‍රීහර්ෂෝ විතතාර ගද්‍යකවයේ බාණාය වාණීඵලං

සද්‍යඃ සත්ක්‍රියයා'භිනන්දමපි ච ශ්‍රීහාරවර්ෂෝ'ග්‍රහීත්. (Kumarasvami, 1930, 296. *Ramacarita of Abhinanda,* Canto xxxiii, i.**)**

කාලිදාසගේ කෘතිවලින් හෙළි වන්නේ ඔහු උජ්ජයිනියේ ජීවත් වූ බව යි. එලෙස ම සාම්ප්‍රදායික කථාවල සඳහන් වික්‍රමාදිත්‍ය පිළිබඳ තොරතුරුවලට සහාය වෙමින් සිය නිර්මාණවල ඇතුළත් කොට ඇති 'වික්‍රම' යන යෙදුම නිසා ඔහුගේ අනුග්‍රාහකයා උජ්ජයිනියේ විසූ වික්‍රමාදිත්‍ය කෙනකු විය යුතු බවත් පැහැදිලි ය. ඔහුට ශකාරි යන විශේෂණයක් ද වූ බව අභිනන්දට අනුව පෙනී යයි.

ඉහත සඳහන් කළ කාල පරාසයේ උජ්ජයිනිය පාලනය කළ නරපතීන් අතුරින් වික්‍රමාදිත්‍ය යන විශේෂණය භාවිත කළේ නොහොත් එනමින් හැඳින්වූණේ දෙවැනි චන්ද්‍රගුප්ත සහ ඔහුගේ මුනුපුරා වූ ස්කන්ධගුප්ත දෙදෙනා පමණකි. එයින් ද ශකාරි යන විශේෂණයෙන් හැඳින්විය හැකි වන්නේ දෙවැනි චන්ද්‍රගුප්ත පමණකි. එයට හේතුව මේ දෙදෙනා අතුරින් චන්ද්‍රගුප්ත විසින් ක්‍රි.ව. **4** වැනි සියවසේ අගභාගයේ දී ගුජරාට් සහ කතියවාර් ප්‍රදේශයේ ශක ක්‍ෂත්‍රප රාජ්‍ය විනාශ කිරීම ප්‍රබල පුරාවිද්‍යාත්මක හා සාහිත්‍යමය සාක්ෂි මඟින් සනාථ වීම ය. මේ පිළිබඳ අදහස් දක්වන Majumdar සිය ප්‍රධාන සම්පාදකත්වයෙන් ප්‍රකාශිත '*The history and culture of the Indian people: Vol. III. The classical age*' නම් කෘතියෙහි මෙලෙස අදහස් දක්වයි. "ඔහුගේ ප්‍රධාන ප්‍රතිවාදියා වූයේ ගුජරාටයේ සහ කතියවාර් අර්ධද්වීපයේ ශක පාලකයා ය... මෙය ශිලා ලේඛන තුනකින් සනාථ වේ. ඉන් පළමුවැන්න ඔහුගේ සාමය සහ යුද්ධය පිළිබඳ අමාත්‍ය වීරසේනගේ හිල්සා අසල උදයගිරි ගුහා සෙල්ලිපිය යි. දෙවැන්න ක්‍රි.ව. **401-2** දිනැති එම ප්‍රදේශයේ ම වැඩවසම් ප්‍රධානියකු **(Feudatory chief)** වූ සනකානීක මහාරාජාගේ සෙල්ලිපියකි. තුන්වැන්න ක්‍රි.ව. **412-13** දිනැති සාන්චිහි අම්‍රකාර්දව නම් හමුදා නිලධාරියකුගේ සෙල්ලිපියක් වෙයි" **(**Majumdar**,** 1970. **19.**). ඒවායින් පැනෙන තොරතුරුවලට අනුව චන්ද්‍රගුප්ත ශක පාලක III වැනි රුද්‍රසිංහ පරාජය කොට ඔහුගේ රාජධානිය අත්පත් කොටගත්තේ ය. ඔහු විසින් ශක කාසි අනුකරණය කරමින් නිකුත් කරන ලද කාසිවලින් ද එම විජයග්‍රණය තහවුරු වෙයි.

චන්ද්‍රගුප්තගේ සහ කාලිදාසගේ සම්බන්ධතාවත්, එසමයෙහි දේශපාලනික වාතාවරණයත්, ඒ ඇසුරෙන් නිර්මාණකරණයත් වැඩි දුරටත් විස්තර කරන මිරාශි "වික්‍රමාදිත්‍යගේ යොමු කිරීම මත කාලිදාස විදර්භ පළාතෙහි යම් කාලයක් ජීවත් වන්නට ඇත. එහි ජීවත් වෙමින් සිටිය දී හේ වාකාටක අගනුවර අසල රාම්ගිරිහි **(**Ramagiri වර්තමාන රාම්ටෙක් Ramtek මෙය මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ, නාග්පූර් දිස්ත්‍රික්කයේ පිහිටි නගරයකි. මෙහි ඇති පර්වතය සහ එහි පිහිටි පුරාණ දේවාල ඉතා ප්‍රසිද්ධය.) දී ඔහු "මේඝදූත" කාව්‍යය ලිවී ය. එමෙන් ම එහි දී "සේතුබන්ධ" කිරීමට II වැනි ප්‍රවරසේනට සහාය වන්නට ඇත." යනුවෙන් ප්‍රකාශකරයි (මිරාශි, **41.**). තවදුරටත් එම තොරතුරු ඉදිරියට ගෙන ගිය හොත් එවකට පැවති දේශපාලන තත්ත්වය ඔහුගේ කෘතිවලින් පිළිබිඹු වන ආකාරය දැකගත හැකි ය. වික්‍රමාදිත්‍ය යන නමේ සම්බන්ධතාව වික්‍රමෝර්වශීය නාට්‍යයේ පැහැදිලි ව දැකගත හැකි ය. කුමාරසම්භවය චන්ද්‍රගුප්තගේ පුත් කුමාරගුප්තගේ උපන් දින සංවත්සරය නිමිත්තෙන් රචනා වීමට බොහෝ ඉඩ ඇත. රඝු රාජවංශයේ රඝුගේ මහා ජයග්‍රහණය විස්තර කිරීමේ දී කවියා දෙවැනි චන්ද්‍රගුප්තගේ මහා ජයග්‍රහණය පිළිබඳ වර්ණනයක් කරන්නට ඇත.

දෙවැනි චන්ද්‍රගුප්තගේ කාලය වසර පහක තරම් සුළු වෙනසක් සහිත ව ඉතිහාසඥයන් විසින් හඳුනාගෙන ඇත. ඒ ඔහුගේ උදයගිරි ගුහා සෙල්ලිපිය ඇසුරිනි. එහි ප්‍රකාශිත වර්ෂය වන ක්‍රි.ව. 3**80** චන්ද්‍රගුප්තගේ අභිෂේකයෙන් පස්වැනි වසර ලෙස සහ පළමුවැනි වසර ලෙස විද්වතුන් විසින් ප්‍රථමේ සහ පඤ්චමේ ලෙස දෙපරිද්දකට කියවා ඇත. "ඔහුගේ රාජ්‍යාභිෂේක දිනය ක්‍රි.ව. **380** හෝ **375** විය හැකි ය. දෙවැන්නෙහි වැඩි සම්භාවිතාවක් විද්‍යමාන වෙයි. දෙවැනි චන්ද්‍රගුප්ත ක්‍රි.ව. **413** සහ **415** අතර කාලයේ දී මිය ගිය අතර වසර තිස් තුනකට වැඩි කාලයක් රාජ්‍ය පාලනය කළේ ය" **(**Majumdar**,** 1970. **18.**). යනුවෙන් Majumdar චන්ද්‍රගුප්තගේ සමය නිශ්චිත ව ප්‍රකාශ කරයි.

මෙම තොරතුරුවලට අනුව කාලිදාස දෙවැනි චන්ද්‍රගුප්ත සමයේ (375 - 415) ඔහුගේ අනුග්‍රහය ලබමින් සිය සාහිත්‍ය නිර්මාණ සිදු කරන්නට ඇතැයි බොහෝ දුරට නිශ්චිත ව ප්‍රකාශ කළ හැකි වෙයි.

## 04. සමාලෝචනය

මෙම පර්යේෂණ අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව කාලිදාසගේ කාලය පිළිබඳ ක්‍රි.පූ. අටවැනි සියවසේ සිට ක්‍රි.ව. එකොළොස්වැනි සියවස දක්වා විහිදෙන ප්‍රධාන මත දහයක් පමණ හඳුනාගත හැකි විය. ඒවා විශ්ලේෂණයේ දී ක්‍රි.පූ. 8" ක්‍රි.පූ. 2" ක්‍රි.පූ. 1 වැනි ඉතා පැරණි ස්ථානගත කිරීම, අග්නිවර්ණ, අග්නිමිත්‍ර සහ වික්‍රම සංවත්සර ආරම්භ කළා යැයි සැලකුණ වික්‍රමාදිත්‍ය සම්බන්ධය ප්‍රබල ඓතිහාසික සාක්ෂ්‍ය නොමැති නිසා ප්‍රතික්ෂේප කළ හැකි වෙයි. රඝුවංශයේ හූණ පරාජය, මේඝදූතයේ දිඞ්නාග පිළිබඳ සඳහන ආදිය ඇසුරින් කාලිදාසගේ කාලය පිළිබඳ ඉදිරිපත් වූ මතයන් ද දුර්වල බව හෙළි වන අතර එකොළොස්වැනි සියවසේ වික්‍රමාදිත්‍ය සමග සම්බන්ධතාව ද ජනප්‍රවාදාගත අවිනිශ්චිත වූවකි. අශ්වඝෝෂ සමග සමානතා සලකා බැලූ විට කාලිදාස ඔහුට පසුකාලීන විය හැකි බව තහවුරු විය. රඝුවංශයේ අගස්ති චිහ්නය සහ අභිඥානශාකුන්තලයේ චන්ද්‍ර-රෝහිණී යෝගය වැනි ජ්‍යොතිර් විද්‍යාත්මක මතයන් ද අවසන් නිගමනයකට ප්‍රමාණවත් නො වෙයි. දෙවැනි චන්ද්‍රගුප්ත රජ සමය ඇතුළත් ක්‍රි.ව. 350-425 කාලය කාලිදාසගේ ජීවන සමය ලෙස ගැනීම වඩාත් උචිත බව විශ්ලේෂිත කරුණුවලින් මතු වූ ප්‍රබල හා පිළිගත හැකි සාක්ෂ්‍ය ඇසුරෙන් නිගමනය කළ හැකි වෙයි. මෙම නිගමනයට පදනම් වන්නේ කාලිදාසගේ කෘතිවල භාෂා-ශෛලීමය පරිණාමය, ගුප්ත යුගයේ සංස්කෘතික-සමාජීය සන්දර්භය සමග ගැලපීම, භාස, වාත්ස්‍යායන වැනි පූර්වකාලීනයන්ගේ බලපෑම්, වීරසේන සහ සනකානීකගේ උදයගිරි සෙල්ලිපි (ක්‍රි.ව. 401-413) සහ සාන්චිහි අම්‍රකාර්දවගේ සෙල්ලිපිය, වත්සභට්ටිගේ මන්දසෝර් ශිලාලේඛනය (ක්‍රි.ව. 473), රවිකීර්තිගේ කීර්තිමත් සඳහන් සහිත ඓහෝල් ප්‍රශස්තිය (ක්‍රි.ව. 634) වැනි ඓතිහාසික සාක්ෂ්‍යයන් සහ කාලිදාසගේ මාලවිකාග්නිමිත්‍රය, වික්‍රමෝර්වශීය සහ කුමාරසම්භවය, බාණගේ හර්ෂචරිතය, වැනි පසුකාලීන උපුටා දැක්වීම් ය. ශක පරාජය, කුන්තල-වාකාටක සම්බන්ධතා ආදිය මඟින් ඔහුගේ කාලය ගුප්ත යුගයේ ස්වර්ණමය අවදියක බව තහවුරු කෙරෙයි.

මෙම තොරතුරු සමාලෝචනයෙන් කාලිදාසගේ කාලය ක්‍රි.ව. සිවුවැනි සියවසේ දෙවැනි භාගයේ සහ පස්වැනි සියවසේ සියවස මුල් භාගය දක්වා වන බව හඳුනාගැනිණි. ඒ අනුව ක්‍රි.ව. 350-425 පමණ කාලිදාස ජීවත් වන්නට ඇතැයි වඩාත් විශ්වසනීය ලෙස පැවසිය හැකි වෙයි.

## පරිශීලිත මූලාශ්‍රය


Acharya, N. R., (Ed.). (1948). *The Raghuvamsa of Kālidāsa: With the Sanjivinī commentary of Mallinātha. extracts from other commentaries, critical and explanatory notes, various readings & indexes* (11th ed.). Nirnaya Sagar Press.

Aiyangar, K. A. N. S., (1941). *Ancient India and South Indian History and Culture*. Vol I. Ancient India. Orientał Book Agency.

ASI, Reprinted (1996). *Epigraphia Indica*, Vol. VI (1900–01). Swati Publications.

Basham, A. L., (1954). *The Wonder That Was India*. Sidgwick and Jackson.

Bhattacharyya, B., (Ed.). (1938). *Sūktimuktāvalī Of Jalhaṇa*. Oriental Institute.

Cowell, E. B., (Ed.) (1893). *The Buddha-carita of Aśvaghoṣa*. Clarendon Press.

Cowell, E. B., and Thomas, F.W., (trans) (1897). *The Harṣa-carita of Bāṇa.* Royal Asiatic society,

Dalal, C. D. Sastry, R. A., (Eds.) (1934). *Rājaśekhara's Kāvyamīmāṃsā.* Oriental Institute.

Dharmachakra Translation Committee (Trans.) (2013). *The play in full (Lalitavistara, Toh 95).* 84000: Translating the Words of the Buddha.

Fauche, H. **(**trad. et ed.) (2001). *Oeuvres complètes de Kalidasa, traduites du sanscrit en français pour la première fois [2 volumes]* Paris, A.Durand 1859-1860 Complet en **2** tomes **–** oeuvres choisies de Kalidasa: Traduites par Hippolyte Fauche, **2**nd ed. Publisher : Adamant Media Corporation.

Jain, R. C. (2024). *Kumara-Sambhavam 5th Canto of Mahakavi Kalidas.* ResearchGate.

Jayaswal, K. P., (1933). *History of the Väkätaka Empire. Journal of the Bihar and Orissa Research Society (J.B.O.R.S.)*.

Jha, V. M., (Ed.) (1982). *Aucityavicāracarcā of* Kṣemendra. Chowkhamba Vidyabhawan.

Johnston, E. H. (Ed.) (1928). *The Saundarananda of Aśvaghoṣa.* Humphrey Milford, Oxford University Press. (Panjab University Oriental Publications)

Jones, W., (1799). *The works of Sir William Jones: In six volumes* (Vol. 1). Pall-Mall: G. G. & J. Robinson; R. H. Evans.

Josyer, G. R., (Ed.). (1955). *Sringara Prakasha of Maharaja Bhojaraja*. *- First eight chapters*. Coronation Press.

Keith, A. B., "The Date of Kumaradasa," *The Journal of the Royal Asiatic Society of Great Britain and Ireland*, no. 3 (1901). P. 578 – 582. *The Royal Asiatic Society.*

Keith, A.B., (1927**)**. *Classical Sanskrit Literature*, Oxford University press.

Keith. A.B., (1959). re. *The Sanskrit Drama*, Oxford University press.

Kumarasvami, K. S., (Ed.) (1930). *Ramacarita of Abhinanda*, Oriental Institute.

Majumdar, R. C., (Ed.). (1970). *The history and culture of the Indian people*: Vol. III. The classical age (3rd ed.). Bharatiya Vidya Bhavan.

Majumdar, R. C., & Pusalker, A. D., (Eds.). (1951). *The History and Culture of the Indian People*. Volume II: The Age of Imperial Unity. Bharatiya Vidya Bhavan.

Moriz Winternitz's (1927). *A History of Indian Literature* (Vol. 1). University of Calcutta.

Mukhopadhyaya, S., (Ed.) (1960). *The Aśokavadana.* Sahitya Academy.

Pandeya, M., (Ed.) (1988). *श्रीकालिदासप्रणीतं ज्योतिर्विदाभरणम्।* Motilal Banarsidass.

Paradkar, M. D., (Ed.) (2014). *Kalidasa's Malavikagnimitram (A critical study)*. Motilal Banarsidass Publishers.

Paranavitana, S. Godakumbura, C. E. (Eds.) (1967). *The Janakiharana of kumaradasa.* Sri Lanka Literature Board.

Pathak, K. B., (Ed.) (1916). *Kalidasa's Meghaduta*.The Oriental Books Supplying Agency.

Roy, P. C., (Trans.) (1886). *"The Mahabharata of Krishna-Dwaipayana Vyasa: Vol. 5. Bhishma Parva".* Oriental Publishing Co.

Sane, P.S., Godbole, G.H., and Ursekar, H.S., (Eds.) (1950). *Mālavikāgnimitra of Kalidasa*, Booksellers' publishing Co.

Śarman, V., (Ed.) (1922). *Kālidāsas Meghadūtam with Mallinātha's Saṃjīvinī commentary.* Nirṇaya Sāgara Press.

Sengupta, P. C., (1936). *Ancient Indian chronology illustrating some of the most important astronomical methods*. University Press.

Sharma, R., (Ed. & Trans.) (2001). *Kamasutram of Sri Vatsyayana Muni*. Krishnadas Academy.

Shastri, V. P. R. R., (Ed.) (1938). *Kāvyādarśa of Daṇḍin*. Bhandarkar Oriental Research Institute.

Stein, M. A., (Trans.) (1900). *Kalhana's Rajatarangini: A chronicle of the kings of Kasmir* (Vol. 1). Archibald Constable and Company, Ltd.

Tawney. C. H., (trans.) (1964). *Mālavikāgnimitra, A Sanskrit play by Kalidasa.* Indological Book House.

Tucci, G., (1972). Reviewed Work(s): *The Jānakīharaṇa of Kumāradāsa by S. Paranavitana and C.E. Godakumbura* Review by: Giuseppe Tucci Source: East and West, September-December 1972, Vol. 22, No. 3/4 (September December 1972), Published by: Istituto Italiano per l'Africa e l'Oriente (IsIAO)

Vaidya, R. B. C. V.. (1921). History of Medieval Hindu India.
ථාපර්, ආර්., (1994). *ඉන්දියාවේ ඉතිහාසය, අධ්‍යාපන. ප්‍රකාශන දෙපාර්තමේන්තුව (පරි.)* අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
තිලකසිරි, ජේ., (2007). *සංස්කෘත කාව්‍ය සාහිත්‍යය*, සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.
ද සිල්වා, සී., (සංස්.) (1954). *පැරකුම්බා සිරිත,* එම්. ඩී. ගුණසේන සමාගම.
දේවානන්ද හිමි, එම්., (පරි.) (1999). *කුමාරසම්භව මහාකාව්‍යය.* කුරුළුපොත්.
ධීරානන්ද හිමි, ජී., (පරි.) (1936). *රඝුවංශප්‍රදීපිකා නම් රඝුවංශ මහාකාව්‍යය.* සත්මිණ.
පඤ්ඤාසාර හිමි, ඩී., (2015). *සංස්කෘත සාහිත්‍යය.* බාලසූරිය, ඊ. ඒ. ඡ (පරි.) සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.
බෂාම්, ඒ. එල්., (1995). *අසිරිමත් ඉන්දියාව*, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව (පරි). අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
*භාරතචරිත - කෘෂ්ණ කවි,* ත්‍රිවේන්ද්‍රම් ග්‍රන්ථ මාලාව අංක 86 (1.4)
මිරාශි, වී. වී., (1956). *කාලිදාස.* හින්දි ග්‍රන්ථ රත්නාකර ලිමිටඩ්.
රණවීර, ඩී. (1963). *ඉන්දීය ඉතිහාස ප්‍රවේශය.* ආරියදාස සහ සමාගම.
සන්නස්ගල, පී. බී., (1994). *සිංහල සාහිත්‍ය වංශය.* සංස්කෘතික දෙපාර්තමේන්තුව.
සුරවීර, ඒ. වී., සහ තවත්. (සංස්.) (1998). *මයූරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමිගේ පූජාවලී*, ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.
සේනානායක, ජී. එස්. බී., (පරි.) (1965). *සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය.* සී. ස. ගුණසේන සහ (පුද්.) සමාගම.
සේනානායක, ජී. එස්. බී., (1960). ද්විතීය. සංස්කෘත සාහිත්‍යය. සී. ස. ගුණසේන සහ (පුද්.) සමාගම.
https://books.google.lk/books?id=JVOm8BDvXtMC
https://read.84000.co/translation/toh95.html
https://whatisindia.com/inscriptions/earlyguptakings/theguptainscriptions120.html
https://www.researchgate.net/profile/Rajendra-Jain-4/publication/381650061_Kumara-Sambhavam_5th_Canto_of_Mahakavi_Kalidas_by_DrRajendra_C_Jain/links/66786492d21e220d89cb96b9